වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்தசெயலாற்றுகைஅறிக்கைமற்றும்கணக்கு

Annual Performance Report

2021



දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර

மாவட்டசெயலகம் - கண்டி

District Secretariat – Kandy

මහනුවර දිස්ත්‍රික් ලේකම්ගේ / දිසාපතිතුමාගේ පණිවුඩය...



දිස්ත්‍රික් පරිපාලනයේ ඉහළම පාලන මධ්‍යස්ථානය වන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයි. ශ්‍රීලංකාවේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 අතරින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ශ්‍රී දන්ත ධාතූන් වැඩ වසන කන්ද උඩරට ඓතිහාසික නගරයක් ලෙසද ලෝක උරුම නගරයක් ලෙස දෙස් විදෙස් සියළු දෙනාගේ ගෞරවාදරයට පත් වී ඇති අතර සංස්කෘතික උරුමය ප්‍රෞඩ ඉතිහාසය සහ ස්වාභාවික පරිසරය එය තව දුරටත් තීව්‍ර කිරීමට සමත් වී ඇත.

මහනුවර දිස්ත්‍රික්කය වර්ග කිලෝමීටර 1940 ක වපසරියකින් යුක්ත වන අතර ජනගහණය 1,483105කි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක් ද ග්‍රාම නිලධාරී කොට්ඨාස 1188 ක් ද ගම් 2588 කින්ද යුක්ත වේ.

ප්‍රාදේශීය සංවර්ධනයට පුළුල් දායකත්වයක් ලබාදීම සඳහා ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථාන වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 තුළ ඉහළ කාර්යසාධනයක් පවත්වා ගනිමින්අවශ්‍ය උපාය මාර්ග භාවිතා කර නිරන්තර අධීක්ෂණ කටයුතු කළ අතර තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමටඅවශ්‍ය පසුබිම නිර්මාණය කෙරිණි.

ගෝලීය ව්‍යවසනයක් වන කොවිඩ් - 19 වසංගත තත්වය යටතේ 2021 වසරේ දිවයිනේ බෝහෝ රාජ්‍ය හා පෞද්ගලික ආයතන ද වසා තැබූ අවස්ථාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සෞඛ්‍ය, ආරක්ෂක හා අනෙකුත් අංශ සමග මනා සම්බන්ධීකරණයක් ඇති කර ගනිමින් මහජනයාගේ සුබසාධන කටයුතු අඛණ්ඩව හා කඩිනමින් ඔවුන් වෙත ලබා දීමට හැකිවීම අප ලැබූ විශාල ජයග්‍රහණයකි.

අප සතු මානව සම්පත මනාව සංවර්ධනය කරගනිමින් පාරිභෝගික සත්කාරයට උචිත ආයතනික පරිසරයක් නිර්මාණය කරමින් සුහදශීලි මහජන සේවාවක් සැපයීම අරමුණ කොටගෙන 2021 වසරේ මහනුවර දිස්ත්‍රික් පරිපාලනයේ සිට ග්‍රාමීය මට්ටම දක්වා සමස්ත යාන්ත්‍රණයම පිළිඹිඹු කරන්නාවූ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව මෙසේ එළි දැක්වීමට කැපවුණු නිලධාරී මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරමි.

චන්දන තෙන්කෝන්

දිස්ත්‍රික් ලේකම් /දිසාපති , මහනුවර

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්

පරිපාලන සිතියම - මහනුවර දිස්ත්‍රික්කය





මූලික තොරතුරු



පළාත		මධ්‍යම
දිස්ත්‍රික්කය		මහනුවර
වර්ග ප්‍රමාණය (ව.කි.මී.)		1,940
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව		20
ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව		1,188
ගම් සංඛ්‍යාව		2,588
ඡන්ද ප්‍රදේශ සංඛ්‍යාව		13
මහා නගර සභා සංඛ්‍යාව		01
නගර සභා සංඛ්‍යාව		04
ප්‍රාදේශීය සභා සංඛ්‍යාව		17
අධ්‍යාපන කලාප සංඛ්‍යාව		06
පාසැල් සංඛ්‍යාව (2020 වසර අනුව)		651
ගුරුවරු සංඛ්‍යාව (2020 වසර අනුව)		17,782
ශිෂ්‍ය සංඛ්‍යාව (2020 වසර අනුව)		274,557
රෝහල් (මහ/ශික්ෂණ/දිස්ත්‍රික්/ග්‍රාමීය) සංඛ්‍යාව		57
ආයුර්වේද මධ්‍යස්ථාන සංඛ්‍යාව		15
ඡන්ද දායකයින් සංඛ්‍යාව (2020 ඡන්දභිමි නාම ලේඛනය අනුව)		1,140,168
ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව		12
ගරු පළාත් සභා මන්ත්‍රීවරු සංඛ්‍යාව(මහනුවර දිස්ත්‍රික්කය)		29
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති සංචාරක නිවාස සංඛ්‍යාව		01
මුළු ජනගහනය (2020 වසර අනුව)		1,483,105
ස්ත්‍රී පුරුෂ	(2020 වසර අනුව)	775,951 707,154
ගෘහ ඒකකගණන	(2012 ජන හා නිවාස සංගණනයට අනුව)	348,019
නිවාස ඒකක ගණන		342,911

පෙළගැස්ම

මහනුවර දිස්ත්‍රික් ලේකම්ගේ /දිසාපතිතුමාගේ පණිවුඩය ii

පරිපාලන සිතියම -මහනුවර දිස්ත්‍රික්කය iii

මූලික තොරතුරු iv

01 පරිච්ඡේදය 1

හැඳින්වීම 1

1.1 මහනුවර දිස්ත්‍රික්කය හැඳින්වීම 1

1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ හැඳින්වීම 5

1.3 දැක්ම, අගයන් හා මෙහෙවර 6

1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් 7

1.6 සංවිධාන ව්‍යුහය 9

1.7 දිස්ත්‍රික් ලේකම් මඟින් අධීක්ෂණය වන ප්‍රධාන අංශ 10

1.8 මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10

02 පරිච්ඡේදය 11

ප්‍රගතිය හා ඉදිරි දැක්ම 11

2.1 විශේෂ උත්සව/ අවස්ථා 11

2.2 මහනුවර දිස්ත්‍රික්කයේ විශේෂ ජයග්‍රහණ 34

2.3 ඉදිරි ඉලක්ක 40

2.4 අභියෝග 41

03 පරිච්ඡේදය 42

සමස්ථ මූල්‍ය කාර්යසාධනය 42

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 42

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 43

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 44

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 45

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 56

3.6 දිස්ත්‍රික් ලේකම් **258** වැය ශීර්ෂයේ වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ සාධනය 56

3.7 මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස ලැබුණු ප්‍රතිපාදන උපයෝජනය 57

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 65

3.9 විගණකාධිපති වාර්තාව 66

04 පරිච්ඡේදය 78

ආයතනයේ කාර්ය සාධන දර්ශක **(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)** 78

4.1 සැලසුම් අංශය 78
4.2 ඉංජිනේරු අංශය 78
4.3 ගිණුම් අංශය 79
4.4 ආයතන අංශය 79
4.5 ජන හා සංඛ්‍යා ලේඛන 82
4.6 ආපදා කළමණාකරණ ඒකකය 83
4.7 දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය 84
4.8 ඉඩම් අංශය 84
4.9 ආගමික කටයුතු (බෞද්ධ කටයුතු) 85
4.10 ආගමික කටයුතු (හින්දු ආගමික කටයුතු) 86
4.11 ආගමික කටයුතු (ක්‍රිස්තියානි ආගමික කටයුතු) 86
4.12 ආගමික කටයුතු (ඉස්ලාම් ආගමික කටයුතු) 86
4.13 සංස්කෘතික අංශය 87
4.14 ජාතික ඒකාබද්ධතා හා රාජ්‍ය භාෂා අංශය 89
4.15 කුඩා ව්‍යාපාර අංශය 89
4.16 මිනුම් ඒකක හා ප්‍රමිති සේවා අංශය 90
4.17 පාරිභෝගික කටයුතු අංශය 90
4.18 පරිවාස හා ළමාරක්ෂක සේවා 90
4.19 කාන්තා හා ළමා කටයුතු 91
4.20 මුල් ළමාවිය සංවර්ධනය අංශය 92
4.21 මානව සම්පත් සංවර්ධන අංශය 92
4.22 විදේශ රැකියා කටයුතු අංශය 93
4.23 විද්‍යා තාක්ෂණ අංශය 93
4.24 අංශය. ඵලදායිතා 94
4.25 දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය 94
4.26 සංවර්ධන අංශය 95
4.27 සමෘද්ධි අංශය 96
4.28 ජලජීවී අංශය 96
4.29 දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය 97
4.30 සමාජ ආරක්ෂණ අංශය 97
4.31 සමාජ සේවා අංශය 97
4.32 සමාජ සේවා අංශය (වැඩිහිටි) 98
4.33 සමාජ සේවා (උපදේශණ) 99
4.34 ක්‍රීඩා අංශය 99

4.35 රාජ්‍ය නොවන සංවිධාන අංශය /ක්ෂුද්‍ර මූල්‍ය 100
4.36 මෝටර් රථ අංශය 101
4.37 අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය 101
4.38 අභ්‍යන්තර විගණන අංශය 102
4.39 ව්‍යවසාය සංවර්ධන අංශය 102
05 පරිච්ඡේදය 103
තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය.....103
06 පරිච්ඡේදය 104
මානව සම්පත් පැතිකඩ.....104
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.....104
6.2 සේවක සංඛ්‍යා කළමනාකරණය ප්‍රාදේශීය ලේකම් කාර්යාල 104
6.3 මානව සම්පත් සංවර්ධනය 105
07පරිච්ඡේදය 107
අනුකූලතා වාර්තාව.....107

01 පරිච්ඡේදය
හැඳින්වීම

1.1 මහනුවර දිස්ත්‍රික්කය හැඳින්වීම

මනහර කඳුවැටි හා නිම්න භූමිවලින් සැදුම්ලත් මහනුවර දිස්ත්‍රික්කය මධ්‍යම කඳුකරයේ වර්ගකිලෝමීටර් 1,940 ක භූමි ප්‍රමාණයක් වසා පැතිරී ඇති මනරම් භූමි භාගයකි.උතුරින් මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල, රත්තොට, ලග්ගල-පල්ලේගම හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ද, නැගෙනහිරින් බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, දකුණින් බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ, හඟුරන්කෙත, කොත්මලේ, නුවරඑළිය හා අඹගමුව කෝරළේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගෙන් ද, බටහිරින් කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක,බුලත්කොහුපිටිය, මාවනැල්ල හා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගෙන් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම හා රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගෙන් මායිම් වී පවතින මහනුවර දිස්ත්‍රික්කය, උතුරු අක්ෂාංශ 60.56 ත් 70.29 හා නැගෙනහිර දේශාංශ 80.25 ත් 80.0 අතර පිහිටා ඇත.

මහනුවර දිස්ත්‍රික්කයේ වැඩි භූමි ප්‍රදේශයක් ස්පර්ශ කරමින් ගලා යන මහවැලි ගංගාව දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශවලින් ගලා එන ජලධාරාවන්ගෙන් පෝෂණය වේ. මීට අමතරව දැදුරු ඔයේ ආරම්භක ජලධාරා පෝෂණය වන්නේද පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. දිස්ත්‍රික්කයේ යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල බටහිර බෑවුමෙන් ගලා යන ජලධාරා මා ඔයට එක් වී එහි ධාරිතාවය වැඩි කරයි.

ඓතිහාසික පසුබිම

අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන මහනුවර, අනුරාධපුර හා පොළොන්නරු යුගයන්වලදී මලය රට ප්‍රදේශයට අයත්ව තිබූ අතර ගම්පොළ රජ කළ තුන්වන වික්‍රමබාහු රජ දවස නගරයක් වශයෙන් දියුණු කළ බව ජනප්‍රවාදයේ දැක්වේ. සෙංකඩගල නුවර නමින් එදා හැඳින්වූ මහනුවර පළමු වන විමලධර්මසූරිය රජතුමා විසින් සිංහල රාජධානියේ අග නගරය ලෙස යොදා ගනිමින් අලංකාර දළදා මන්දිරයක්, රජ මාළිගයක් ඇතුළු සියලුම අංගවලින් සම්පූර්ණ නගරයක් බවට පත් කරන ලදි. එතැන් සිට සියවස් තුනක පමණ කාලයක් පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන බටහිර බලවත් ජාතීන්ගෙන් නිර්මල බුදු දහම හා සිංහල සංස්කෘතිය ආරක්ෂාකර ගනිමින් 1815 මාර්තු 02 වන දින දක්වා සිංහල රාජධානියේ අගනුවර වශයෙන් සෙංකඩගල පුරවරය නොසැලී පැවතුනි. මුහුදුබඩ පළාත් බටහිර ජාතීන් පාලනය කළ යුගයේ දී ඔවුන් විසින් මහනුවර රාජධානියට වරින් වර එල්ල කෙරුන ආක්‍රමණයන්ට එරෙහිව සිදු වූ ජයග්‍රාහී සටන් බොහෝමයක් මහනුවර ආශ්‍රිතව සිදු විය. දෙවන රාජසිංහ රජ සමයේ පේරාදෙණිය, ගන්නෝරුවේ දී සහ යටිනුවර දන්තුරේ දී සිදු වූ සටන්වලින් ආක්‍රමණික විදේශ හමුදා සම්පූර්ණයෙන්ම විනාශයට පත් විය. විදේශිකයන්ගෙන් සිංහල රාජධානිය රැක ගැනීමට පිහිට වූ ප්‍රධාන බල කොටුවක් වන බලන කොටුව වර්තමාන කඩුගන්නාව නගරය ආසන්නයේ පිහිටා ඇත.

1815 දී විවිධ දේශපාලන අර්බුද නිසා මහනුවර රාජධානිය බ්‍රිතාන්‍ය ජාතිකයන්ට අයත් වූ පසු අවසන් සිංහල රජ වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු එම වසරේ පෙබරවාරි 15 වන දින මැදමහනුවර බෝමුරේ ගම්මානයේ දී ඉංග්‍රීසින් විසින් අල්ලා ගන්නා ලදි. 1815 මාර්තු මස 02 වන දින මහනුවර මහල් මඩුවේ දී අත්සන් තැබුණු උඩරට ගිවිසුම මඟින් ශ්‍රී ලංකාවේ පාලනය ඉංග්‍රීසින් අතට පත් වූ අතර ඔවුන් විසින් රටේ අග නගරය ලෙස කොළඹ භාවිතා කරන තෙක්ම රටේ ප්‍රධාන නගරය ලෙස සැලකුනේ මහනුවරයි.

සිංහල ඉතිහාසයේ අවසන් නිදහස් සටන වන 1818 දී ඌව - වෙල්ලස්ස කැරැල්ල වෙනුවෙන් මහනුවර ප්‍රදේශයේ රදළ නායකයින් විශාල පිරිසක් නායකත්වය දී ඇත. සිය තනතුරු පසෙකලා නිදහස් සටන වෙනුවෙන් කැපවුනු මොණරවිල කැප්පෙටිපොළ, මඩුගල්ල ආදී නායකයන් බොහෝ දෙනෙකුගේ නිජ බිම වී ඇත්තේ මහනුවර ප්‍රදේශයයි.1818 නිදහස් අරගලය කෲර ලෙසමැඩපැවැත් වූ ඉංග්‍රීසින් විසින් මහනුවර ප්‍රදේශය ඇතුළු කඳුකරය වැවිලි කර්මාන්තය හා වෙළඳාම මත පදනම් වූ ආර්ථික රටාවක් කරා ගෙන යන ලදි. වැවිලි ආර්ථිකය යටතේ මුලින්ම හඳුන්වා දුන් කෝපි වගාව දිලීර රෝගයක් නිසා විනාශ වූ පසු දිවයිනේ සිටුවන ලද පළමු තේ ගස දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලූල්කඳුර වතු යායේ අදත් දක්නට ඇත

ඓතිහාසික ස්ථාන

මුළු මහත් ලෝකයේම බෞද්ධ ජනතාවඅතර ගෞවරවයට පාත්‍ර වූ ඓතිහාසික වශයෙන් වැදගත් වූ සිද්ධස්ථාන විශාල ප්‍රමාණයක් මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

1. දළදා මාලිගාව
2. ගඩලාදෙණිය විහාරය
3. ඇම්බැක්ක දේවාලය
4. දෙගල්දොරුව රජමහා විහාරය
5. ගල්මඩුව රජමහා විහාරය
6. තලාව රජමහා විහාරය

දේශගුණික හා පාරිසරික ලක්ෂණ

දිස්ත්‍රික්කයේ මාසික වර්ෂාපතනය - 2017 - 2019

මධ්‍යම කඳුකරය ප්‍රධාන වශයෙන් මුහුදු මට්ටමේ සිට මීටර් 100 -1,600 ත් අතර උසකින් යුක්තව පිහිටා ඇත. එසේ වුවද මහනුවර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ප්‍රදේශය, මහවැලි ගඟට මායිම්ව මුහුදු මට්ටමේ සිට මීටර් 100 ක පමණ උසින් යුතුව තැනිතලා ස්වභාවයක් ගනී. සාමාන්‍යමාසික වර්ෂාපතනය මි.මී. 212ක අගයක් ගන්නා අතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ප්‍රදේශය වන මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කඳුකර හා පහතරට වියළි කලාපීය දේශගුණික ලක්ෂණයන් සහිතය.

මාසය	වර්ෂාපතනය 2018 (මිලි මීටර්)	වර්ෂාපතනය 2019 (මිලි මීටර්)	වර්ෂාපතනය 2020 (මිලි මීටර්)
ජනවාරි	20.3	3.60	23.0
පෙබරවාරි	39.5	55.10	3.8
මාර්තු	42.7	20.00	56.9
අප්‍රේල්	215.9	222.90	107.2
මැයි	344.5	17.90	316.6
ජූනි	138.5	82.00	129.5
ජූලි	48.2	96.80	115.5
අගෝස්තු	180.7	165.80	114.2
සැප්තැම්බර්	157.8	72.00	219.1
ඔක්තෝබර්	450.5	471.20	59.5
නොවැම්බර්	291.6	171.30	160.9
දෙසැම්බර්	99.1	164.40	189.3

මූලාශ්‍රය - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

දිස්ත්‍රික්කයේ මාසික උපරිම හා අවම උෂ්ණත්වය -2018–2019

සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 20-22 අතර අගයක් ගන්නා අතර වසර පුරාම සෞම්‍යදේශගුණයක් දිස්ත්‍රික්කයේ වැඩි භූමි ප්‍රදේශයක පවතී. සාමාන්‍යයෙන් දෙල්තොට, පස්බාගේ කෝරළේ,ගඟඉහළ කෝරළේ, උඩදුම්බර, පන්විල ආදී ප්‍රදේශ උෂ්ණත්වයෙන් සාපේක්ෂව අඩු අගයක් ගන්නා අතර ප්‍රධාන වශයෙන් වියළි කලාපයේ පිහිටා ඇති මිනිපේ ප්‍රදේශය සාපේක්ෂව වැඩි උෂ්ණත්වයකින් යුක්තය.

අනු අංකය	මාසය	උෂ්ණත්වය 2019 (සෙල්සියස් අංශක)		උෂ්ණත්වය 2020 (සෙල්සියස් අංශක)	
		උපරිම	අවම	උපරිම	අවම
1	ජනවාරි	29.8	18.5	30.7	19.8
2	පෙබරවාරි	31.0	20.6	31.4	20.3
3	මාර්තු	33.2	19.9	33.6	-
4	අප්‍රේල්	32.4	21.5	33.1	21.7
5	මැයි	31.7	21.5	30.7	22.8
6	ජූනි	29.9	22.2	29.5	21.8
7	ජූලි	28.5	21.3	29.4	21.7
8	අගෝස්තු	29.1	21.7	29.2	21.3
9	සැප්තැම්බර්	29.1	21.2	28.0	21.6
10	ඔක්තෝබර්	29.0	21.1	29.2	21.3
11	නොවැම්බර්	30.0	21.1	30.1	21.4
12	දෙසැම්බර්	28.5	20.7	28.5	20.3

මූලාශ්‍රය- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

මහවැලි ගංගාව දිස්ත්‍රික්කය මැදින් ගලා යන ප්‍රධාන ගංගාව වන අතර එය මුළු දුරෙන් ආසන්න වශයෙන් කි.මී. 110 ක දුරක් මහනුවර දිස්ත්‍රික්කය ආශ්‍රිතව ගලා බසී. මහවැලි ගංගාවේ ආරම්භක ජල ධාරා වන හැටන් ඔය සහ කොත්මලේ ඔය එක් වී මහවැලි ගංගාව නමින් ගලා බැසීම පටන් ගන්නේ ද පස්බාගේ කෝරළේ පොල්වතුර නම් ග්‍රාමයේ දී ය. එමෙන්ම මහවැලි කලාපයේ ප්‍රධාන කඳු ශිඛරය වන කොබෝනීල ගල(උස මීටර් 1,553.87), දෝතළුගල(උස මීටර් 1,642.57) ආදී කඳුවැටි මහනුවරදිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත.සාමාන්‍ය වර්ෂාපතනය ඉහළ අගයක් ගන්නා මෙම කලාපය මහවැලි ගඟේ සහ අඹන් ගඟේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශයක් වේ. ශ්‍රී ලංකාවට ආවේණික ශාක සහ සත්ත්ව ප්‍රජාවට රැකවරණය සලසන නකල්ස් කඳුවැටිය දිස්ත්‍රික්කයේ ස්වභාව සෞන්දර්යය අතින් ඉහළම තැනක් ගන්නා ප්‍රදේශයකි. හන්තාන කඳුවැටිය, අම්බුළුවාව කන්ද, බලන කඳුවැටිය, අලගල්ල කන්ද වැනි කඳු ප්‍රදේශ මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර කඩියන්ලෙන, ගලබොඩ ආදී සුන්දර දිය ඇළි විශාල ප්‍රමාණයක් ද මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. මේ දිය ඇළිවලින් විශාල ප්‍රමාණයක් අප්‍රකටව පවතින මුත් සුන්දරත්වය අතින් ඉහළ අගයක් ගනී.

ස්වභාවික වෘක්ෂලතා

මහනුවර දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 194,000ක් වේ. දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් 21%ක් එනම් හෙක්ටයාර 41,521ක් වනාන්තර වශයෙන් පවතී. දැඩි රක්ෂිතයන් ලෙස රැක ගත යුතු මෙම වනාන්තරවලින් හෙක්ටයාර 23,317 භූමි ප්‍රමාණයක් සන වනාන්තර වශයෙන් ද හෙක්ටයාර 10,759 ක් විවෘතවනාන්තර සහ හෙක්ටයාර 7,445 ක ප්‍රමාණයක් වන වගා ලෙස ද පවතී.උස් කඳු මුදුන් ආශ්‍රිතව ද වැඩි වනගහනයක් දක්නට ඇත. මේ හේතුවෙන් ප්‍රදේශයේ ජල උල්පත්වල පැවැත්ම සඳහා මෙම වනාන්තර ප්‍රමාණය ආරක්ෂා කර ගැනීම දැඩි අවශ්‍යතාවක් වන අතර විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙහි පැවැත්මට තර්ජන

එල්ලවන අවස්ථා ඇත. නකල්ස් රක්ෂිතයට අයත් වන ප්‍රදේශයෙන් විශාල භූමි ප්‍රමාණයක් මහනුවර දිස්ත්‍රික්කයට අයත් වේ. ශ්‍රී ලංකාවට ආවේණික ශාක හා සත්ත්ව වර්ග කීපයකට වාසභූමිය වන මෙම කලාපය දැඩි ස්වභාවික රක්ෂිතයක් ලෙස නම් කර ඇත. හන්තාන කඳුවැටිය, වාකරවත්ත කැලේහා උඩවත්ත කැලේ මහනුවර නගරාසන්නයේ පිහිටා ඇත. හන්තාන කඳුවැටිය දැඩි පාරිසරික තර්ජනයකට ලක් වූ ප්‍රදේශයකි.

වන සතුන්

මහනුවර දිස්ත්‍රික්කයේ වනාන්තර ආශ්‍රිතව විශාල වන සත්ත්ව ප්‍රජාවක් ජීවත් වන අතර අලියා, දිවියා, වඳුරා, වල් ඌරා, කොළ දිවියා, මුවා, වැලි මුවා ඒ අතර ප්‍රධාන තැනක් ගනී. උඩදුම්බර, මිනිපේ යන ප්‍රදේශවල වල් අලින් දක්නට ඇති අතර රන්දෙණිගල අභය භූමිය හා උඩදුම්බර මීමුරේ ප්‍රදේශ ආශ්‍රිතව නිරන්තරයෙන් වල් අලි සැරිසරති. මෙම ප්‍රදේශවල විශාල ලෙස පැතිරුණු වනගහනය තුල දිවියන් ද ජීවත් වන අතර ගම්පොළ, හන්තාන, පාතහේවාහැට යන ප්‍රදේශවලින් ද දිවියන් පිළිබඳව විටින් විට වාර්තා වේ. දිස්ත්‍රික්කයේ සෑම ප්‍රදේශයකම කැලෑ ආශ්‍රිතව වඳුරන්, රිලවුන් සහ වල් ඌරන් ජීවත් වන අතර රන්දෙණිගල අභයභූමිය ආශ්‍රිතව තිත් මුවන්, ගෝනුන් සහ වැලි මුවන් වැනි සත්ත්ව විශේෂ දක්නට ඇත. මීට අමතරව පක්ෂි විශේෂයන් ද සැළකිය යුතු ප්‍රමාණයක් ප්‍රදේශය ආශ්‍රිතව ජීවත් වේ.

ජීවන රටාව

මහනුවර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 1,475627 වන අතර මෙහි නාගරික, ග්‍රාමීය හා වතු යන අංශ තුනම නියෝජනය කරන ජනගහන රටාවක්ද දක්නට ලැබේ. දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් 182,974 (12% ක්) නාගරික අංශයද, 1,200,796 (81% ක්) ග්‍රාමීය අංශයද, 91,857 (7%ක්) වතු අංශයද නියෝජනය කෙරේ. සමස්තයක් වශයෙන් ගත් කළ මහනුවර දිස්ත්‍රික්කය තුළ කෘෂිකාර්මික ආර්ථික රටාවක් දැකිය හැකිය. ඉඩම් පරිහරණ රටාව දෙස බලන විට අස්වද්දන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 16,129ක් වන අතර එය දිස්ත්‍රික්කයේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 8.3% ක් පමණ වේ. එසේම තේ, පොල්, රබර්, කුරුඳු හා වෙනත් වගාවන් පිළිවෙලින් හෙක්ටයාර 22,559, 1,230, 4,729, 81 හා 17,564 ක් වේ. 12% ක් පමණ වන නාගරික ප්‍රදේශවල අධික ජන ඝනත්වයක් දක්නට ලැබෙන අතර ඔවුන් කර්මාන්ත හා සේවා ක්ෂේත්‍ර යටතේ තම ජීවන වෘත්තීන්වල නිරත වීමක් දක්නට ලැබේ. ඒ අනුව මෙම ක්ෂේත්‍රයන් ඔස්සේ නාගරික ජනතාව දිස්ත්‍රික්කයේ ආර්ථිකයට දක්වන දායකත්වය සුවිශේෂී වේ.

වාරිමාර්ග පද්ධතිය

මහනුවර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග පද්ධතිය දෙස බැලීමේදී මිනිපේ ව්‍යාපාරය, මුරපොළ ඇළ ව්‍යාපාරය, ගම්පොළවෙල ව්‍යාපාරය, උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරය ප්‍රධානතම වාරිමාර්ග පද්ධති ලෙස හඳුන්වා දිය හැක. මහනුවර දිස්ත්‍රික්කයට අයත් එකම ගොවි ජනපදය වශයෙන් මිනිපේ ව්‍යාපාරය හැඳින්විය හැකි අතර පළමුවැනි අග්බෝ රජ සමය දක්වා ඈත අතීතයකට නැකම් කියන මිනිපේ ජනපදය මහා වටිනා සම්පතකි. මෙම ජනපදය 1931 වර්ෂයේදී මහාමාන්‍ය ඩී.එස් සේනානායක මහතා විසින් ආරම්භ කරන ලදී.මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව පවතින මෙම ව්‍යාපාරයේ ජල මූලාශ්‍රය වන්නේ මහවැලි ගඟය. මෙහි ප්‍රධාන ඇළ මාර්ගය මිනිපේ වම් ඉවුර වන අතර එහි දිග ප්‍රමාණය කි.මී.74 කි. එසේම බෙදුම් ඇළවල් 1,556 කින් හා කෙත් ඇළවල් 491 කින් සමන්විත මිනිපේ ව්‍යාපාරයේ මුළු වගා වපසරිය අක්කර 18,595ක් වේ. වගා ප්‍රභේදයන් ලෙස වී හා අතිරේක බෝග වගාව හඳුන්වා දිය හැකි අතර වගා ප්‍රභේදයෙන් 80%ක් වී වගාව වන අතර ඉතිරි 20% අතිරේක බෝග වගාව වේ. මුරපොළ ඇළ ව්‍යාපාරය මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට හා පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02 ට අයත්ව පවතින අතර ප්‍රධාන ඇළේ දිග කි.මී.15.5 කි. මෙහි වගා වපසරිය අක්කර 1,200 ක් වන අතර, වී හා අතිරේක බෝග වගා ප්‍රභේද ලෙස පෙන්වා දිය හැක.මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව 2,600 කි. පාතදුම්බර, පන්විල හා කුණ්ඩසාලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පවතින උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරයේ ජල මූලාශ්‍රය රවන් ඔය වන අතර ප්‍රධාන ඇළේ දිග කි.මී.7.1 කි. මෙහි වගා වපසරිය අක්කර 405 ක් වන අතර වී හා එළවළු බෝග ප්‍රධාන වේ. උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරය මඟින් පවුල් 1,000 ක් ප්‍රතිලාභ ලබයි. උලපනේ ඔය ජල මූලාශ්‍රය කොටගත් ගම්පොළවෙල රජ ඇළ ව්‍යාපාරය ගහඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත. මෙහි ප්‍රධාන ඇළේ දිග කි.මී.12.8 ක් වන අතර වගා කරන බිම් ප්‍රමාණය අක්කර 405 කි. මෙමඟින් ප්‍රතිලාභ ලබන පවුල් ප්‍රමාණය 1,000 කි.

1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ හැඳින්වීම

මධ්‍යම පළාතේ ප්‍රධානතම දිස්ත්‍රික්කය වන මහනුවර දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20කින් ද, පළාත් පාලන බලප්‍රදේශ 22කින් ද, ග්‍රාම නිලධාරී වසම් 1,188කින් ද සමන්විත වන මහනුවර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 1,475627. මුළු ජනගහනයෙන් 74.4% ක් සිංහල ද, 11.2% ක් ද්‍රවිඩ ද, 13.9% ක්මුස්ලිම් ද, 0.5% ක් වෙනත් ජාතීන්ගෙන් ද සංයුක්ත වේ.

විටින් විට විවිධ විදේශීය ආක්‍රමණවලට ලක්වූව ද කන්ද උඩරට රාජධානිය ස්වාධීනව පැවති නමුදු වර්ෂ 1815 මාර්තු දෙවෙනිදා අත්සන් කරන ලද උඩරට ගිවිසුමත් සමඟම එහි ස්වාධීනත්වයද බිඳී යමින් සමස්ත ලක්දිවම බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කන්ද උඩරට පැවති රජු මුල් කර ගත් දේශීය රාජ්‍ය පරිපාලන ව්‍යුහය මුළුමනින්ම බිඳ වැටුණු අතර බ්‍රිතාන්‍ය අණසකට යටත් පරිපාලන රටාවක් බිහි විය. ඒ අනුව බ්‍රිතාන්‍ය යුගයේ මධ්‍යම පළාතේම ප්‍රධාන පරිපාලන නිලධාරියාමහනුවර කච්චේරියේ දිසාපතිවරයා විය. ඉතිහාසගත තොරතුරු මූලාශ්‍ර වලට අනුව මහනුවර කච්චේරිය ක්‍රි.ව. 1825 දී මහනුවර රජගෙදර කේන්ද්‍ර කොටගෙන ආරම්භ කොට ඇත. මහනුවර ප්‍රථම දිසාපතිවරයා ලෙස සුදු ජාතික ජෝර්ජ් ටර්නර් මහතා 1825 සිට 1837 දක්වා කාලය තුළ කටයුතු කොට ඇත.

මහනුවර රජගෙදර කේන්ද්‍ර කොටගෙන පවත්වාගෙන යනු ලැබූ මහනුවර කච්චේරිය 1868 දී ශ්‍රී දළදා මාළිගාවේ පත්තිරිප්පුව වෙත රැගෙන ගොස් ඇති බවටද තොරතුරු හමුවෙයි. එවකට මහනුවර සමයේ දිසාපතිවරයා ලෙස කටයුතු කොට ඇත්තේ සුදු ජාතිකයෙකු වූ පී.ඩබ්. ඛේබෲක් මහතාය.

පසු කාලීනව විවිධ හේතූන් මත මහනුවර කච්චේරිය මහනුවර තැපැල් කාර්යාල ගොඩනැගිල්ලට තාවකාලිකව ගෙන ගොස් ඇත. පසුව 1880 දී ශ්‍රී දළදා මාළිගාවට සමීපව ඉදිකළගොඩනැගිල්ලට (පසු කාලීනව උසාවි ගොඩනැගිල්ල) ගෙන ගොස් ඇති අතර එවකට දිසාපතිවරයා ලෙස කටයුතු කොට ඇත්තේ සුදු ජාතිකයෙකු වූ එෆ්.බී.ටෙම්ප්ලර් මහතාය. එවක් පටන් අවුරුදු 80 ක් පමණ රාජකාරී කටයුතු අඛණ්ඩව සිදු වී ඇත්තේ එම ස්ථානයේය.

1957 වර්ෂයේ දී මහනුවර කච්චේරිය දැනට යටිනුවර වීදියේ පවත්නාගොඩනැගිල්ලට ගෙන ගොස් ඇති අතර එවකටදිසාපතිවරයාලෙස කටයුතු කර ඇත්තේ ඒ.බී.එස්.එන් පුල්ලෙයාර් මහතාය.1946 වර්ෂයේ සිට ලංකා සිවිල් සේවයේ නිලධාරීන් දිසාපතිවරුන් වශයෙන් සේවයකර ඇත. 2018 නොවැම්බර් මස 19 සිට 2020 සැප්තැම්බර් මස දක්වා විවිධ රාජ්‍ය ආයතන ගණනාවක සේවා අත්දැකීම් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වන ඩී.එම්.එන්.ජී.ජී.තිස්ස කරුණාරත්න මහතා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකල අතර වර්තමාන දිසාපතිවරයා වශයෙන් විවිධ රාජ්‍ය ආයතන ගණනාවක සේවා අත්දැකීම් සහිත චන්දන තෙන්නකෝන් මහතා 2020 සැප්තැම්බර් මස සිට මේ දක්වා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ අංශ 25 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ස්ථාපිත කර ඇති අතර ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද, රජයේ විගණන කාර්යාලයද ,බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා මැතිවරණ දෙපාර්තමේන්තුවද මෙම ගොඩනැගිල්ල තුළම ස්ථාපිත කර ඇත

1.3 දැක්ම, අගයන් හා මෙහෙවර



1.4 තත්ත්ව ප්‍රතිපත්තිය



1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

➢ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය, අධීක්ෂණය හා එම නිලධාරින්ගේ ආයතන කටයුතු. (නිලධාරින්ගේ සේවය ස්ථීර කිරීම්, කඩඉම් පරීක්ෂණ පැවැත්වීම්, උසස් වීම්/සේවය දීර්ඝ කිරීම් හා නිලධාරින්ට වැටුප් ණය අත්තිකාරම් ලබා දීම් වැනි ආයතනික පහසුකම් සැලසීම)

➢ දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති වසම් 1,188 ක ග්‍රාම නිලධාරින්ට අදාළ වූ ආයතන රාජකාරි ඉටු කිරීමෙන් ඔවුන් තුළ යහපත් මානසික තෘප්තියක් ඇති කිරීම.

➢ ශ්‍රී දළදා මාළිගාව ප්‍රමුඛ මල්වතු අස්ගිරි මහා විහාර සහ අනෙකුත් බෞද්ධ විහාරස්ථාන කටයුතු, ශ්‍රී දළදා පෙරහැර සංවිධාන කටයුතු, දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ කටයුතු ඇතුළු බෞද්ධ ආගමික කටයුතු.

➢ හින්දු, ඉස්ලාම්, කතෝලික හා අනෙකුත් ආගම්වලට අදාළ කටයුතු.

➢ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව, දිස්ත්‍රික් නිවාස කමිටුව, දිස්ත්‍රික් පාරිසරික නීති ක්‍රියාත්මක කිරීමේ කමිටුව, දිස්ත්‍රික් ආරක්ෂක/ආපදා කළමනාකරණ කමිටුව, දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටුව වැනි කමිටු පැවැත්වීමෙන් හා දිස්ත්‍රික් ලේකම් ප්‍රධානත්වයෙන් පැවැත්විය යුතු සියලු රැස්වීම් සංවිධානය කරමින් අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.

➢ ආර්ථික සංවර්ධන කටයුතු සහ ජලය, විදුලිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සමඟ දිස්ත්‍රික් ආයෝජන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

➢ මහනුවර නගරය හා දිස්ත්‍රික්කය විශේෂ වශයෙන් සළකා පවරනු ලබන ජාතික මට්ටමේ උත්සව හා විවිධ රාජ්‍ය උත්සව සංවිධානය කර පැවැත්වීම.

➢ මැතිවරණ දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය කරමින් දිස්ත්‍රික්කයේ මැතිවරණ කටයුතු මෙහෙයවීම.

➢ නවක රාජ්‍ය නිලධාරින් පුහුණු කිරීම හා දැනට සේවයේ නිරත රාජ්‍ය නිලධාරින්ගේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීම උදෙසා කාලීන අවශ්‍යතා මත පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම.

➢ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ව්‍යවස්ථාපිත හා සංවර්ධනාත්මක කාර්යයන් ප්‍රශස්ත ආකාරයෙන් ඉටු කරවීම සහ යහපත් මූල්‍ය පරිපාලනයක් ඇති කිරීම සඳහා කාර්යාල අධීක්ෂණ ක්‍රමවේදයක් ඇතිකර එය වර්ෂය පුරා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය මඟින් පරීක්ෂා කිරීම,නිවැරදි කරවීම් සහ මඟපෙන්වීම් ලබාදීමට කටයුතු කිරීම.

➢ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්පත් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රමසම්පාදන කටයුතු ඉටු කිරීම.

➢ දිස්ත්‍රික සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

➢ මහජනයාගෙන් ලැබෙන පැමිණිලි, පෙත්සම්, දුක් ගැනවිලි, ඉල්ලීම් යනාදිය සම්බන්ධව අදාළ අංශ වෙතින් තොරතුරු ලබා ගෙන විසඳුම් ලබාදීම හා දිස්ත්‍රික් පරිපාලනයට හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ නිලධාරින් සම්බන්ධව ලැබෙන පෙත්සම්, පැමිණිලි සම්බන්ධව අපක්ෂපාති පරීක්ෂණ පැවැත්වීම තුළින් යහපත් පාලනයක් ඇති කිරීම.

➢ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ අධීක්ෂණයේ පවතින කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, පාරිභෝගික අධිකාරිය, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය, සමාජ ආරක්ෂණ අංශය, දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය, සංඛ්‍යා ලේඛන අංශය, මෝටර් රථ ප්‍රවාහන, සංස්කෘතික හා බෞද්ධ කටයුතු, ආපදා කළමනාකරණ කටයුතු, දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය, ජාතික ජලජීවී වගා ව්‍යාප්ති අංශය, සමාජ සේවා අංශය,ඵලදායිතා අංශය, මානව සම්පත් හා වෘත්තීය මාර්ගෝපදේශන අංශය,ළමා හා කාන්තා කටයුතු, ක්‍රීඩා අංශය, කෘෂිකර්ම සහ සමෘද්ධි යන අංශ සම්බන්ධීකරණය සහ අධීක්ෂණය.

➢ මහනුවර දිස්ත්‍රික්කය තුළ කොස්, දෙල් ගස් හෙළීම සඳහා ගස් සංඛ්‍යාව 03කට වඩා වැඩි 15කට වඩා අඩු අවස්ථාවන්වලදී බලපත්‍ර නිකුත් කිරීම අනුමත කිරීම සහ ගස් සංඛ්‍යාව 15 ට වඩා වැඩි අවස්ථාවන්වලදී කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත නිර්දේශ ලබා දීම.

➢ මහනුවර දිස්ත්‍රික්කය තුළ ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම, වාර්ෂිකව පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ලබා දීම.

➢ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේ කාර්යාල සඳහා ජල, විදුලි හා අභ්‍යන්තර දුරකතන පහසුකම් සැළසීම තුලින් මහජන සේවා සැපයීමට යටිතල පහසුකම් සැපයීම.

➢ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් අධීක්ෂණය වන කාර්යාලවල ආයතන කටයුතු ඉටු කිරීම.

➢ මහනුවර දිස්ත්‍රික්කයෙහි සිදු වන ස්වාභාවික සහ හදිසි ආපදාවන්වලදී පීඩාවට පත්වන ජනතාවට කඩිනම් සහන සැලසීම සඳහා අවශ්‍ය ක්ෂණික පියවර ගැනීම සහ දිර්ඝ කාලීන විසඳුම් අවශ්‍ය වන අවස්ථාවන්වලදී අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය පියවර ගැනීම.

➢ දිස්ත්‍රික්කයෙහි කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය සහ රජය විසින් ජනතාවට සහන සැලසීම උදෙසා වන කාර්යයන්කඩිනමින් ඉටු කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කාර්යයන් ඉටු කිරීම.

➢ දිස්ත්‍රික් පරිපාලන විෂය පථය තුළ මහනුවර නගරයට හා මහනුවර දිස්ත්‍රික්කයට විශේෂිතව කාලීන පැවරෙන විශේෂ කාර්යයන් සංවිධානය,පරිපාලනය හා නියාමනය සඳහා අවශ්‍ය පියවරයන් ගැනීම.

1.6 සංවිධාන ව්‍යුහය


මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - සංවිධාන ව්‍යුහය
දිස්ත්‍රික් ලේකම් /දිසාපති හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්
අතිරේක දිස්ත්‍රික් ලේකම්
ප්‍රධාන ගණකාධිකාරි
ප්‍රධාන සැලසුම්කරු
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)
ප්‍රධාන සහකාර විගණක
දිස්ත්‍රික් ඇපැයිම් කොමසාරිස්
ඇපැයිම් කොමසාරිස් (ඉඩම් සම්බන්ධීකරණ)
ඇපැයිම් කොමසාරිස් (ඉඩම් සම්පාදන)
දිස්ත්‍රික් ඉඩම් කොමසාරිස්
සහකාර දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ඉඩම් කොමසාරිස්
දිස්ත්‍රික් සැලසුම්කරු
දිස්ත්‍රික් ගණකාධිකාරි
දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන නිලධාරි
දිස්ත්‍රික් කාර්මික අධ්‍යක්ෂක
සහකාර කාර්මික නිලධාරි
සහකාර කම්කරු කොමසාරිස්
ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් ඒකකය
සැලසුම් අමාත්‍යාංශය
සැලසුම් ඒකකය
ගණකාධිකාරි අමාත්‍යාංශය
ගණකාධිකාරි ඒකකය
සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සංඛ්‍යාලේඛන ඒකකය
කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුව
කම්කරු ඒකකය
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
ඉඩම් ඒකකය
ඇපැයිම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
ඇපැයිම් ඒකකය
ඉඩම් සම්පාදන කොමසාරිස් දෙපාර්තමේන්තුව
ඉඩම් සම්පාදන ඒකකය
ඉඩම් සංරක්ෂණ කොමසාරිස් දෙපාර්තමේන්තුව
ඉඩම් සංරක්ෂණ ඒකකය
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
ඉඩම්

1.7 දිස්ත්‍රික් ලේකම් මඟින් අධීක්ෂණය වන ප්‍රධාන අංශ

1.අභ්‍යන්තර විගණන අංශය	18.ඉඩම් අංශය
2. .ආගමික කටයුතු / භාෂා ඒකාබද්ධතා අංශය	19.විදේශ රැකියා කටයුතු අංශය
3. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය	20. සංස්කෘතික අංශය
4. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය	21.ඵලදායිතා අංශය
5.කුඩා ව්‍යාපාර අංශය	22. සමෘද්ධි අංශය
6.මෝටර් රථ අංශය	23.ආයතන අංශය
7.පාරිභෝගික කටයුතු අංශය	24. දිස්ත්‍රික් ළමා හා කාන්තා කටයුතු අංශය
8. ජල ජීවී වගා සංවර්ධන අංශය	25. පුපුරණ ද්‍රව්‍ය අංශය
9. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය	26.ක්‍රීඩා අංශය
10. දිස්ත්‍රික් මාධ්‍ය අංශය	27.දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය
11. මානව සම්පත් සංවර්ධන අංශය	28.ගිණුම් අංශය
12. සංඛ්‍යා ලේඛන අංශය	29.පොලිස් කොමිසම
13.සංවර්ධන අංශය	30. මැතිවරණ
14. සමාජ ආරක්ෂණ අංශය	31.ව්‍යවසාය සංවර්ධන අංශය
15. සමාජ සේවා අංශය (වැඩිහිටි/උපදේශන)	32.අන්තරායකර ඖෂධ පාලක අංශය
16. ක්‍රමසම්පාදන අංශය.	33.සමථ අංශය
17.ඉංජිනේරු අංශය	

1.8 මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
1	ගඟවට කෝරළේ	11	මැදඋම්බර
2	කුණ්ඩසාලේ	12	උඩඋම්බර
3	පාතඋම්බර	13	මිණිපේ
4	පන්විල	14	අකුරණ
5	යටිනුවර	15	පූජාපිටිය
6	උඩුනුවර	16	හාරිස්පත්තුව
7	උඩපළාත	17	තුම්පනේ
8	දොළුව	18	හතරලියද්ද
9	පාතහේවාහැට	19	ගඟ ඉහළ කෝරළේ
10	දෙල්තොට	20	පස්බාගේ කෝරළේ

02 පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ උත්සව/ අවස්ථා





දිස්ත්‍රික් ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ 2021 වර්ෂ ආරම්භක සෙත් පිරිත් සජ්ඣායනය, ප්‍රතිඥාව සහ උදෑසන හමුව.





ගරු දිසාපති තුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති 73 වන නිදහස් දින උළෙල









2021 ඇසළ පෙරහැර මංගල්‍යය






දේශපාලන නායකත්වයෙන් පැවැත්වූ ග්‍රාමීය ආර්ථික යටිතල පහසුකම් කමිටුව 2021.01.27




ගරු වාරිමාර්ග අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ ග්‍රාමීය ආරථික යටිතල පහසුකම් කමිටුව 2021.01.12




මීමුරේ ගම සමග පිළිසඳරක් වැඩසටහන පැවැත් වීමට පෙර පැවති සාකච්ඡාව 2021.01.25




වැඩිහිටි දීමනා ලබාදීම




යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල විවෘත කිරීම

ගරු වාරිමාර්ග සහ රාජ්‍යාරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු මහනුවර දිස්ත්‍රික්කයේ දේශපාලන නායකයින් සහ ගරු ආණ්ඩුකාරතුමා, මහනුවර දිස්ත්‍රික් ලේකම්තුමන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් සහභාගී විය.




මහනුවර දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේ නිලවරණය.




2021 මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව පැවැත්වූ කාන්තා ව්‍යවසායක ප්‍රදර්ශනය




කාන්තා දින සැමරුම 2021.03.08

.




දොඩම්වල ආබාධිත පාසැල් ශ්‍රමදානය




දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතීඥ වසන්ත යාපා බණ්ඩාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම




ජල සුරක්ෂිත තාව සඳහා පැවති වැඩසටහන




මැදකැලේ ගම්මානයේ ගැටළු සොයා බැලීම සඳහා දිසාපති තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාව.




දිසාපති තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මිණිපේ කෘෂි කමිටුව හා නිරීක්ෂණ චාරිකාව




දේශීය සම්පත් නගා සිටුවීමේ කමිටුව (අප්‍රේල් මස)




දිසාපති තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මීමුරේ ගම සමග පිළිසඳරක් පෙර විපරම් වැඩසටහන




කොරෝනා උවදුර මර්ධනය කිරීම සම්බන්ධව පැවති හමුව (මැයි මස)




ජාතික ක්‍රීඩා දිනයක් නම් කිරීමට සමගාමීව මහජනතාව වෙනුවෙන් පැවැත්වූ ශරීර සුවතා වැඩසටහන




උපාය මාර්ගික නාගරික සංවර්ධනය පිළිබඳ විශේෂ වැඩසටහන




සහන් එලිය වැඩසටහන




ස්ව අභිමානී ජාතික සම්මාන උළෙලට සමගාමීව පැවැත්වූ ස්වශක්ති ඇගයීමේ සම්මාන උළෙල වැඩසටහන



ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත යාපාබණ්ඩාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් “එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙකු බිහිකිරීමේ වැඩසටහන" යටතේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් වෙත යන්ත්‍රෝපකරණ බෙදා දීම.



ජාත්‍යන්තර කාන්තා දිනය නිමිති කර ගනිමින් තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලේ දන් දීමේ කඳවුර පැවැත්වීම



කුසගිනි නැති තුරුලිය ඇති දැහැමි රටක් ගොඩනැගීම තේමා කරගත් වැඩසටහන - යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය



කොවිඩ් වසංගතය පරදා ළමා දිවිය ජයගනිමු තේමා කරගත් 2021.03.11 දින යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැවැත්වූ වැඩසටහන



ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ " ලිය ශක්ති " ජංගම අළෙවි සැල විවෘත කිරීම



මල් උයනට යන තේමාව යටතේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන



ගරු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නවක උපාධිධාරීන් සඳහා පත්වීම් ලිපි ලබාදීම



ගරු ප්‍රවාහන අමාත්‍ය දිළුම් අමුණුගම මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වීරක්කොඩි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 398 කුඹුරේගම වසමේ ප්‍රජා පොලිස් කාර්යාලය විවෘත කිරීම



2021.02.04 නිදහස් දිනය වෙනුවෙන් පැල සිටුවීමේ වැඩසටහන තුම්පනේ ප්‍රාදේශීය ලේකම් තුමියගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක කිරීම



2021 වසරේ තුම්පනේ කොට්ඨාශයේ පවත්වන ලද සාහිත්‍ය උත්සවය



ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිලදරු අභිමන් ප්‍රසංගාභිශේකය 2021



තුම්පනේ කොට්ඨාශයේ ආබාදිතයන් වෙනුවෙන් ලබාදෙන අබාධිත දීමනාව හිමි ප්‍රතිලාභියකුට ආධාර ලබාදෙමින්



හිටපු මධ්‍යම පළාත්සභා මන්ත්‍රී පන්විල සම්බන්ධීකරණ කමිටුවේ නියෝජ්‍ය සභාපති ගරු කමල් බෙලිගොල්ල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2021 විශේෂ සෞභාග්‍යා නිවාස සංවර්ධන වැඩසටහන යටතේ පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංගම්මන ග්‍රාම නිලධාරි වසමේ අම්ලා සරෝජනි මියගේ නිවසේ මුල්ගල තැබීම.



හිටපු මධ්‍යම පළාත්සභා මන්ත්‍රී පන්විල සම්බන්ධීකරණ කමිටුවේ ගරු නියෝජ්‍ය සභාපති කමල් බෙලිගොල්ල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සත්ව පාලනය තුළින් ග්‍රාමී ආර්ථිකය ශක්තිමත් කිරීම අරමුණු කොට තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා හිමිකම් පත්‍ර හා වෙක්පත් ලබා දීම



සහස් පෙළහර 2021, ආබාධිත දිනයට සමගාමීව විශේෂ අවශ්‍යතා සහිත පන්විල කොට්ඨාසයේ දරුවන්ගේ විශේෂ කුසලතාවයන් එළිදැක්වීමේ වැඩසටහන



මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී , ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති වසන්ත යාපා මැතිතුමාගේ සහභාගීත්වයෙන් හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෞභාග්‍යා නිෂ්පාදනගම්මාන වැඩසටහන ආරම්භ කිරීම



හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වගා භූමි ආරක්ෂා කරගැනීම සඳහා වගා දැල් ලබාදීම



හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ළමා ආරක්ෂණ රැකවරන නිවසක් ඉදිකිරීම (තිත්තපජ්ජල වසම)







2021.12.04 දින පැවති දිස්ත්‍රික් ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් මහනුවර ශ්‍රී නාථ දේවාල මධ්‍යස්ථානය, කටුගස්තොට රාජ්‍ය සේවා පුහුණු ආයතනය, හා ගම්පොල ජයමාලපුර ජයසුමනාරාමයයේ පැවති දහම් සරසවි ඩිප්ලෝමා පාඨමාලාවේ සමාරම්භක දිනය



ගරු මධ්‍යම පළාත් ආණ්ඩුකාර තුමා, අකුරණ ප්‍රාදේශීය සභා සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගේ ප්‍රධානත්වයෙන් අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දුණුවිල වැව ප්‍රතිසංස්කරණය මුල්ගල්තැබීම



මහනුවර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී තිලක් රාජපක්ෂ මැතිතුමා සහ අකුරණ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රෙජිට්‍රාර් අශයේ නව ගොඩනැගිල්ල විවෘත කිරීම.



මහනුවර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී තිලක් රාජපක්ෂ මැතිතුමා, ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමීය නිශ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීමේ සම්බන්ධීකරණ කමිටුව.



අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උපාධිධාරීන් සඳහා





අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රෙජිට්‍රාර් අංශයේ මහජනතාවට කඩිනමින් තමන්ගේ අවශ්‍යතාවයන් සපුරාගැනීමට නව මෘදුකාංගයක් හඳුන්වාදීම.



අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහජනතාවට සේවාවන් ලබාගැනීමට පහසු කිරීම පිණිස භාෂා උපකාර අංශයක් ආරම්භ කිරීම



හතරලියද්ද ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුල්ගල් තැබීම



උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හේන්දෙණිය සිරිපැරකුම් ප්‍රාථමික විද්‍යාලයට පරිගණකයක් සහ පාසල් උපකරණ ප්‍රධානය කිරීම.







අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහභාගීත්වයෙන් පැවැත්වූ උඩපළාත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය කැකුළු තුරු උද්‍යානජාතික වැඩසටහන



හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ සෞඛ්‍ය අමාත්‍ය ගරු කෙහෙලිය රඹුක්වැල්ල මැතිතුමා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ ප්‍රධානත්වයෙන් නයිමිරිස් වගා ව්‍යාපෘතිය සඳහා භාණ්ඩ බෙදා දීම.



ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත කැටගොඩ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධි නිවාස වෙක්පත් හා භාණ්ඩ ප්‍රදානය - වයි.ජී පේමතිලක



ප්‍රවාහන රාජ්‍ය ගරු අමාත්‍ය දිලුම් අමුණුගම මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැටි වලං කර්මාන්තය වැඩිදියුණුව සහා වෙක්පත් ප්‍රදානය -මහරවෙල



73 වන ජාතික නිදහස සැමරීම වෙනුවෙන් මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රුක්රෝපණය කිරීම



හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිදහස් සිතුවිලි චිත්‍ර තරඟය



මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොවිඩ් වසංගතය



ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති වාහන නියාමන දුම්රිය මැදිරි මෝටර් රථ කර්මාන්ත හා ප්‍රජා පොළිස් සේවා රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගඟවටකෝරළේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කිරි ගව පාලනය ශක්තිමත් කිරීම තුලින් කිරි ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම හා අතුරු නිෂ්පාදනයක් ලෙසට කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය - ගුරුදෙණිය නැගෙනහිර /මාලිගාතැන්න





ප්‍රාදේශීය සභා ගරු සභාපති තුමා ඇතුළු දේශපාලන නියෝජිත ප්‍රධානත්වයෙන් පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාය යෑම් අවදානම් හේතුවෙන් විපතට පත් වූ පවුලක් සඳහා නිවාසයකට මුල්ගල් තැබීම (බෝපිටිය)





පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ළමා සමාජ වල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් නොමැති වීම හේතුවෙන්
ලෝක ළමා දිනයට සමගාමීව “ ඉවත ලන දේ එකතු කරමු- මුදල් උපයමු “ව්‍යාපෘතිය යටතේ ලද ආදායම ළමා සමාජයේ ව්‍යාපෘති සඳහා යොදා ගැනීම.



ප්‍රාදේශීය සභා ගරු සභාපතිතුමා ඇතුළු දේශපාලන නියෝජිත ප්‍රධානත්වයෙන් ලෝක ළමා දිනයට සමගාමීව කුසගිනි නැති තුරුලිය පිරි දැහැමි රටක් නිර්මාණය කිරීම සඳහා දීප ව්‍යාප්තව කොස් පැල 100,000ක් සිටුවීමේ වැඩ සටහනේ සමාරම්භක උත්සවය.



පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිල්දියවර ජල මූලාශ්‍ර හා ජල ප්‍රභව සංරක්ෂණ වැඩසටහන යටතේ අම්බලම්මාන වැව ආශ්‍රිත පැල රෝපණය කිරීමේ වැඩ සටහන



පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයේ ඉඩම්වල පදිංචි පුද්ගලයින් සඳහා දීමනා හා බලපත්‍ර ලබාදීමට ඉඩම් කච්චේරි පැවැත්වීම



පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බිම්මල් වගාව නගා සිටුවීම සඳහා ආධාර ලබා දීම.



නාවලපිටිය නගර සභාවේ ගරු සභාපති තුමා සහ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තුමාගේ ප්‍රධානත්වයෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හඳුන්ගල වත්ත 'දිළිදු ඔබට ගෙයක්' වැඩසටහන යටතේ නිවසක් සෑදීමට මුල් ගල තැබීම.



නාවලපිටිය නගර සභාවේ ගරු සභාපති තුමා සහ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරුසභාපති තුමාගේ ප්‍රධානත්වයෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි ජීවනෝපාය වැඩසටහන යටතේ මහන මැෂින් ලබා දීම.



පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තුමාගේ ප්‍රධානත්වයෙන් ඉහුරුඔය උතුර වසමේ සෞභාග්‍යා නිවාස වැඩසටහන



පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැන්දෝපිටිය ලබුවැල්කොටුව ග්‍රාමයට ගංවතුර ගැලීම.



පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බලංතොට උතුර සහ උඩරඹුක්පිටිය හොරකඩ ඔය පිටාර ගැලීම .



පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොවිඩ් 19 එන්නත්කරණ වැඩසටහන



ගරු වාරිමාර්ග රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මැතිතුමා හා උදයන කිරිඳීගොඩ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්

දෙල්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගලහ උඩදෙල්තොට අඹකුඹුර ඇල සංවර්ධනය කිරීම



ගරු වාරිමාර්ග රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මැතිතුමා හා ගරු මහනුවර දිස්ත්‍රික් පා.ම උදයන කිරිඳීගොඩ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්

දෙල්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සුදුවැල්ල කඳුර ඇළ සංවර්ධනය



ගරු මහනුවර දිස්ත්‍රික් පා.ම උදයන කිරිඳීගොඩ මැතිතුමා හා , පාතහේවාහැට ප්‍රාදේශිය සභා සභාපති තුමාගේ ප්‍රධානත්වයෙන් දෙල්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ නිවාස නොමැති අය සඳහා නිවාස ඉදිකිරීම



"දොළුව හුස්ම රකින තාරුණ්‍යයෙන් පුස්සැල්ලාව රෝහලට ඇඳන් 25 ක්."
2021.05.17



"ස්වේත පද්ම කලා රසාංජලී 2021"දොළුව ප්‍රාදේශීය සාහිත්‍ය උත්සවය 2021.12.09 දින දිස්ත්‍රික් ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.



දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අන්තර් ග්‍රාම සංවර්ධන සමිති වොලිබෝල් තරගාවලිය - 2021.04.03



දොළුව වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානය
ප්‍රතිපාදනමුදල රු. 2,500,000/=



සෞභාග්‍යා සතියට සමගාමීව ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත දොළුව අරලිය උයන කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ කාබනික පොහොර නිෂ්පාදන ඒකකය ආරම්භ කිරීම. (2021.07.07)



දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ "තුම්පැලවක හරිත මිතුරන් තැනූ ජෛව වැටිය" මෙහිදී අඩවිවන නිලධාරීගේ සහාය ඇතිව ජෛව වැටිය යෙදීම සඳහා අඩි 20ක් පළල හා මීටර් 100ක් දිගට වැට යෙදීම.







ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති වාහන නියාමන දුම්රිය මැදිරි මෝටර් රථ කර්මාන්ත හා ප්‍රජා පොළිස් සේවා රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන - විසිතුරු මල් වගා ව්‍යාපෘතිය - තැන්නේකුඹුර, උල්පතකුඹුර ,පල්ලේගම ,අම්පිටිය උඩගම උතුර,වැවතැන්න

දොළුව පල්ලේ ලැගුම්දෙණිය ගෙදර කුඹුර ඇළ.
ප්‍රතිපාදන රු.1,000,000
ප්‍රගතිය රු. 970,000







මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත ගරු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2021.11.10 අපනයන කෘෂි කලාප ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම





මිණිපේ ප්‍රාදේශීය සභාවේ සභාපති ඒ.එම්.එස්.බී. අබේසිංහ මහතා , මොරයාය කොට්ඨාස භාර මන්ත්‍රී ඩබ්.ඒ. වීරසූරිය මහතා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රී නිලන්ත බණ්ඩාර මහතාගේ ප්‍රදානත්වයෙන් මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2021.07.06 දින සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන සෞභාග්‍යා සහල් පිටි සැකසුම් මධ්‍යස්ථානය ඉදිකිරීම



විශ්වලෝක ළමා දිනයට සමගාමීව ZOOM තාක්ෂණය ඔස්සේ ONLINE අධ්‍යාපනය හැදෑරීම සඳහා මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අ.පො.ස (සා.පෙළ) / අ.පො.ස (උ. පෙළ) හදාරන සිසුන් සඳහා නොමිලේ Dialog සිම්පත් 2000 ක් ලබාදීම



මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඩෙංගු මර්දනය සඳහා දායකත්වය ලබාදීම - 18 වංගුව පිරිසිදු කිරීමේ වැඩසටහන දියත් කිරීම



අධික සුළං තත්ත්වය හේතුවෙන් මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හඳගනාව / මොරයාය/ ලුණුමඩලාකැටිය යන ග්‍රාම නිලධාරී වසම් වල නිවාස හානි



මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බුලත්වැල් කදුර ග්‍රාම නිලධාරී වසමේ පවුල් 250 ක් ආවරණය වන පරිදි පිරිසිදු ජලය ලබාදීම



මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිරිය සවිය අඩු ආදායම්ලාභී ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්



මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එලදායිතා ගම්මාන පිහිටුවීමේ වැඩසටහන යටතේ කුකුළු පාලනය



පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෑවල රූප්පවත්ත ක්‍රීඩා පිටිය සංවර්ධනය සහභාගිත්වය ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගුණතිලක රාජපක්ෂ මැතිතුමා



ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගුණතිලක රාජපක්ෂ මැතිතුමාගේ සහභාගිත්වයෙන් පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2021 නිදහස් දින සමරුව හා උඩහේන රක්ෂිතයේ රුක් රෝපණය



පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන සමාරම්භය සහභාගිත්වය ගුණතිලක රාජපක්ෂ මැතිතුමා



පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩමුදුන ශ්‍රී පූර්වාරාම විහාරස්ථානයේදී පැවැත්වූ ජාතික රූපවාහිනී පෝදා වැඩසටහන - ගර්භනී මාතාවන්ට අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබා දීම



පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොරෝනා කාලයේ රැකියා අහිමි වූවන් සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ හා ද්‍රව්‍ය බෙදාදීම



පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධිලාභී හා කාන්තා ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන අලෙවි අවුරුදු පොළ



ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු උප සභාපති හා හිටපු පළාත් සභා මන්ත්‍රී කමල් බෙලිගොල්ල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සෞභාග්‍ය ගම්මාන වැඩසටහන යටතේ වැනිලා වගා ප්‍රතිලාභීන් සඳහා ප්‍රධාන පත්‍ර ලබාදීම - පාතදුම්බර



පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එන්නත්කරණ වැඩසටහන



පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රඹුකේවල ශ්‍රී පූර්වාරාමයේ සංවර්ධන කටයුතු ප්‍රතිපාදන මුදල - රු.ලක්ෂ 5



පාතදුම්බර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු උප සභාපති හා හිටපු පළාත් සභා මන්ත්‍රී කමල් බෙලිගොල්ල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කිරිගවයන් ලබාදීම



පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දුෂ්කර ගම්මානයක් වූ පුඩුකාට්ටුව ගම්මානයේ සිදුකළ ජංගම සේවය



මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත ගරු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මැතිතුමා පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් සඳහා ද්‍රව්‍යාධාර ලබාදීම



උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බේල් මැෂින් යන්ත්‍රය මඟින් අපද්‍රව්‍ය වෙන් කිරීම.



උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිදහස් දින රුක් රෝපණ වැඩසටහන.



තරුණසේවා නිලධාරී විසින් 2021.11.14 දින උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්වූ ලේ දන් දීමේ වැඩසටහන.



පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බංඩාර මැතිතුමා විසින් උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෙලිඔය කරමඩ දකුණ සෞභාග්‍යා නිවාස විවෘත කිරීම.



පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බංඩාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්වූ ලේ දන්දීමේ වැඩසටහන



පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බංඩාර මැතිතුමා විසින් උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෙලිඔය කරමඩ දකුණ නිවසකට මුල් ගල තැබීම.



පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම උදෙසා සමෘද්ධි අංශය හා ඒකාබද්ධව සිදුකරන ලද සමෘද්ධි මාසය





ඌණ සංවර්ධිත විහාරස්ථාන සහ අයහපත් කාළගුණයෙන් විපතට පත් විහාරස්ථාන සංවර්ධන කටයුතු



යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඩු ආදායම්ලාභී අසරණ පවුලක් වන දොඩම්වල චන්ද්‍රාවතී මහත්මියට නිවසක් ඉදිකරදීමට අවශ්‍ය පියවර ගැනීම.



වාරි සෞභාග්‍යා ජාතික වැඩසටහන යටතේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පානබොක්ක වැවේ පිටලය සංවර්ධනය කිරීම
ප්‍රතිපාදන මුදලරු. 1307272.00



යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටබෝගොඩ රජමහා විහාරයේ කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.
ප්‍රතිපාදන මුදල-රු. 2 000000.00



තුම්පනේ කොට්ඨාශයේ සෞභාගයා නිෂ්පාදන ගම්මාන ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති නිකතැන්න ග්‍රාම නිලධාරී වසමේ සත්ව පාලන ව්‍යාපෘති
ප්‍රතිපාදනමුදල : රු .1000,000.00
මුල්‍ය ප්‍රගතිය : රු100 .,000.00



තුම්පනේ කොට්ඨාශයේ විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධන වැඩසටහන. මැදගොඩ ඉහළ ග්‍රාම නිලධාරී වසමේ බිම්මල් ව්‍යාපෘති
ප්‍රතිපාදන මුදල : රු .100,000.00
මුල්‍ය ප්‍රගතිය : රු .100,000.00



තුම්පනේ කොට්ඨාශයේ සෞභාගයා නිෂ්පාදන ගම්මාන යටතේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය. පියදාස මහතාගේ නිවස අසල සිට අත්තනායක මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම
ප්‍රතිපාදන මුදල : රු .500,000.00
මුල්‍ය ප්‍රගතිය : රු .48780.88



හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේ බොකලවෙල පොල්ගස්වෙල්ල මාර්ගය පැතිබැම්ම සහිතව සංවර්ධනය කිරීම



හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔවතැන්න අංක 9ජනපද මාර්ගය සංවර්ධනය කිරීම
ප්‍රතිපාදන මුදල . 5,000,000.00
ප්‍රගතිය රු. 4 -,799,998.74





ඌණ සංවර්ධිත දහම් පාසල් සඳහා උපකරණ ලබා දීම



පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගෙවතු වගාවක් ලෙස දේශීය ඖෂධ වගා කිරීම.



පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිශ්පාදන ගම්මාන වැඩ සටහන
ප්‍රතිපාදන මුදල රු.41,327,802.50
මූල්‍ය ප්‍රගතිය-රු.30,363,374.98



පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පල්ලේගම පහළ දෙණිය මාර්ගය සංවර්ධනය කිරීම ප්‍රතිපාදන මුදල - රු.ලක්ෂ 15





ව්‍යාපෘතියේ නම - වැදිකුඹුර කම්මල් ගම්මාන මාර්ගය සංවර්ධනය - පන්විල
ප්‍රතිපාදන මුදල රු.1,500,000.00
මූල්‍ය ප්‍රගතිය රු.1,462,500.00





ව්‍යාපෘතියේ නම -ගෝමරය ජනපදය ඉහළ කොටස සුසානාගරය සංවර්ධනය - පන්විල
ප්‍රතිපාදන මුදල.- රු.1000,000.00
මූල්‍ය ප්‍රගතිය රු.- රු.999,000.00



අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාරහෙල සෞභාග්‍යා බිම්මල් නිෂ්පාදන ගම්මාන වැඩසටහන
ප්‍රතිපාදන මුදල -රු.මි 9.9
මූල්‍ය ප්‍රගතිය -රු.මි 6.2



අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෞභාග්‍යා දියර කිරි නිෂ්පාදන ගම්මාන වැඩසටහන ,දිප්පිටිය.
ප්‍රතිපාදන මුදල -රු.මි 9.9
16	408	89,527,670	16,000,000	73,527,670	11,456,095	55,373,834	66,829,929	6,697,741	91	9
17	409	169,074,718	17,000,000	152,074,718	11,763,874	137,461,185	149,225,059	2,849,659	98	2
18	412	304,155	-	304,155	-	302,655	302,655	1,500	100	0
19	414	710,276,870	240,000,000	470,276,870	91,768,816	331,315,035	423,083,851	47,193,019	90	10
20	416	930,019	-	930,019	-	926,857	926,857	3,162	100	0

21	421	11,628	-	11,628	-	11,628	11,628	-	100	0
22	422	10,328,036	-	10,328,036	1,000,000	9,313,486	10,313,486	14,550	100	0
23	425	6,436,954	-	6,436,954	3,017,826	2,970,429	5,988,255	448,699	93	7
24	426	495,750	-	495,750	-	-	-	495,750	0	100
25	429	71,713,294	-	71,713,294	27,157,649	39,041,756	66,199,405	5,513,889	92	8
26	431	12,000,000	2,000,000	10,000,000	2,929,450	6,863,414	9,792,864	207,136	98	2
27	432	693,848	340,000	353,848	-	342,342	342,342	11,506	97	3
28	435	1,075,000,000	1,064,000,000	11,000,000	8,068,013	2,050,789	10,118,802	881,198	92	8
මුළු එකතුව		2,551,977,698	1,350,640,000	1,201,337,698	165,176,883	963,438,087	1,128,614,970	72,722,728	94	6

මහනුවර දිස්ත්‍රික්කය

2021 වර්ෂයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනය

අනු අංකය	වැය ශීර්ෂය	ලැබී ඇති මුළුප්‍රතිපාදනය	ප්‍රතිපාදන පවරාදීම්	ශුද්ධ ප්‍රතිපාදනය	අතැති බිල්පත්	2021.12.31 දිනට ගෙවූ වියදම්	2021.12.31 දිනට මුළු වියදම්	2021.12.31 දිනට ඉතිරි ප්‍රතිපාදනය	වියදමේ %	ඉතිරියේ %
1	201	1,801,000	-	1,801,000	-	1,739,079	1,739,079	61,921	97	3
2	202	990,000	-	990,000	-	986,700	986,700	3,300	100	0
3	203	1,000,000	-	1,000,000	-	998,799	998,799	1,201	100	0
4	206	10,000	-	10,000	-	-	-	10,000	0	100
5	216	1,545,104	-	1,545,104	109,574	1,425,248	1,534,822	10,282	99	1
6	217	6,133,664	-	6,133,664	-	6,120,652	6,120,652	13,012	100	0
7	219	107,565	-	107,565	-	103,763	103,763	3,802	96	4
8	237	740,867,948	-	740,867,948	41,656,772	688,967,336	730,624,108	10,243,840	99	1
9	252	120,000	-	120,000	-	119,398	119,398	602	99	1
10	254	2,330,000	200,000	2,130,000	-	2,122,035	2,122,035	7,965	100	0
11	289	3,500,000	300,000	3,200,000	-	3,140,049	3,140,049	59,951	98	2
12	307	1,701,000	-	1,701,000	-	1,640,693	1,640,693	60,307	96	4
13	327	5,408,320	-	5,408,320	-	5,377,254	5,377,254	31,066	99	1
14	328	1,071,940	100,000	971,940	-	883,902	883,902	88,038	91	9
මුළු එකතුව		766,586,541	600,000	765,986,541	41,766,346	713,624,908	755,391,254	10,595,287	99	1

මහනුවර දිස්ත්‍රික්කය

2021 වර්ෂයේ කැබිනට් සහ රාජ්‍ය අමාත්‍යාංශවල පුනරාවර්තන ප්‍රතිපාදන උපයෝජනය

අනු අංකය	වැය ශීර්ෂය	ලැබී ඇති මුළු ප්‍රතිපාදනය	ශුද්ධ ප්‍රතිපාදනය	අතැති බිල්පත්	2021.12.31 දිනට ගෙවූ වියදම්	2021.12.31 දිනට මුළු වියදම්	2021.12.31 දිනට ඉතිරි ප්‍රතිපාදනය	වියදම්වී %	ඉතිරියේ %
1	101	1,527,500	1,527,500	-	1,527,500	1,527,500	-	100	0
2	110	18,973,985	18,973,985	-	17,015,728	17,015,728	1,958,257	90	10
3	111	622,956,000	622,956,000	-	612,802,650	612,802,650	10,153,350	98	2
4	116	6,189,277	6,189,277	-	6,029,484	6,029,484	159,793	97	3
5	118	28,391,511	28,391,511	-	27,794,632	27,794,632	596,879	98	2
6	122	18,078,904	18,078,904	-	15,024,459	15,024,459	3,054,445	83	17
7	130	946,165,880	946,165,880	-	917,376,764	917,376,764	28,789,116	97	3
8	160	5,014,800	5,014,800	-	4,777,500	4,777,500	237,300	95	5
9	193	648,000	648,000	-	527,749	527,749	120,251	81	19
10	194	1,336,500	1,336,500	-	1,037,070	1,037,070	299,430	78	22
11	198	1,839,784	1,839,784	-	1,404,106	1,404,106	435,678	76	24
12	403	407,560,680	407,560,680	10,612,000	390,317,707	400,929,707	6,630,973	98	2
13	408	4,898,317	4,898,317	-	4,250,835	4,250,835	647,482	87	13
14	409	791,127,957	791,127,957	-	789,728,124	789,728,124	1,399,833	100	0
15	409	22,987,859	22,987,859	-	20,956,744	20,956,744	2,031,115	91	9
16	412	30,729,667	30,729,667	-	29,573,834	29,573,834	1,155,833	96	4
17	414	240,630,799	240,630,799	-	239,822,290	239,822,290	808,509	100	0
18	416	10,163,186	10,163,186	-	9,990,780	9,990,780	172,406	98	2
19	421	889,400	889,400	-	664,093	664,093	225,307	75	25
20	425	3,194,550	3,194,550	-	2,890,750	2,890,750	303,800	90	10
21	426	357,958	357,958	-	292,152	292,152	65,806	82	18
මුළු එකතුව		3,163,662,514	3,163,662,514	10,612,000	3,093,804,951	3,104,416,951	59,245,563	98	2

මහනුවර දිස්ත්‍රික්කය

2021 වර්ෂයේ දෙපාර්තමේන්තුවල පූනරාවර්තන ප්‍රතිපාදන උපයෝජනය

අනු අංකය	වැය ශීර්ෂය	ලැබී ඇති මුළුප්‍රතිපාදනය	ශුද්ධ ප්‍රතිපාදනය	2021.12.31 දිනට ගෙවූ වියදම්	2021.12.31 දිනට ඉතිරි ප්‍රතිපාදනය	වියදමේ %	ඉතිරියේ %
1	201	56,835,610.00	56,835,610.00	55,155,001.00	1,680,609.00	97	3
2	202	9,000.00	9,000.00	-	9,000.00	0	100
3	203	2,000.00	2,000.00	2,000.00	-	100	0
4	206	5,829,000.00	5,829,000.00	5,567,487.00	261,513.00	96	4
5	209	825,000.00	825,000.00	825,000.00	-	100	0
6	210	232,066.00	232,066.00	197,234.00	34,832.00	85	15
7	216	21,259,230.00	21,259,230.00	20,617,873.00	641,357.00	97	3
8	217	792,530.00	792,530.00	778,001.00	14,529.00	98	2
9	219	946,256.00	946,256.00	820,277.00	125,979.00	87	13
10	227	24,932,407.00	24,932,407.00	24,305,141.00	627,266.00	97	3
11	252	2,376,228.00	2,376,228.00	2,105,071.00	271,157.00	89	11
12	253	205,040,402.00	205,040,402.00	195,593,391.00	9,447,011.00	95	5
13	254	1,507,905.00	1,507,905.00	1,503,925.00	3,980.00	100	0
14	284	568,790.00	568,790.00	568,790.00	-	100	0
15	286	61,150.00	61,150.00	23,000.00	38,150.00	38	62
16	307	1,666,000.00	1,666,000.00	1,475,380.00	190,620.00	89	11
17	326	27,000.00	27,000.00	25,500.00	1,500.00	94	6
18	327	1,304,825.00	1,304,825.00	1,120,751.00	184,074.00	86	14
19	328	987,222.00	987,222.00	962,370.00	24,852.00	97	3
20	334	586,966,189.00	586,966,189.00	562,239,200.00	24,726,989.00	96	4
මුළු එකතුව		912,168,810.00	912,168,810.00	873,885,392.00	38,283,418.00	96	4

3.8 මෙලෝ නොවන වත්කම්වාර්තා කිරීමේ කාර්ය සාධනය

(රු..000)

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනටහා ණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගති % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	2,485,882,567.29	2,485,882,567.29		
9152	යන්ත්‍රෝපකරණ	418,854,353.64	418,854,353.64		
9153	ඉඩම්	3,757,962,970.00	3,757,962,970.00		
9154	අස්පශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරිගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

මගේ අංකය எனது இல. My No. } කේඩීඒ/ඒ/ම.දි.ලේ/මු.ප්‍ර 2021/2022/15 වෙළුම (ii)

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 මැයි 25 දින

ගණන්දීමේ නිලධාරී
මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර,එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාවේ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය (කෙටියෙන්)	එම වාර්තාවේ ඡේද යොමුව
පසුගිය වර්ෂයේ විගණනය මඟින් පෙන්වා දෙන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඇතුළත් විෂයයන් 03 කට අදාළව ගැලපීම් සිදුකර නොතිබුණි.	සිඑල්පී/කේඩි/ඒ/සම්පිණ්ඩන/2 0/21/40 1.6.1

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවලට අමුණා තිබිය යුතු SA-10,SA-50, SA-71, SA-81 හා SA-90ආකෘති මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

1.6.2.1 ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අඩුවෙන් දැක්වීම

(i) වී මිලදී ගැනීමටභාණ්ඩාගාරයෙන් ලබාදුන් ණය, අත්තිකාරම් කටයුත්තක් බැවින් (සංකේතය - 7000) ඉන් අයකරන ලද වාරික මුදල වූ රු.300,000 ක් අත්තිකාරම් ලැබීම් යටතේ ගිණුම්ගත කළ යුතු වුවද, ආදායම් නොවන ලැබීම්යටතේ වෙනමම සටහන් කර තිබුණි. එසේම ලැබිය යුතු අත්තිකාරම් මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේද දක්වා නොතිබුණි.

(ii) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මූල්‍ය ප්‍රකාශනභාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල ශේෂ පදනම් කරගෙන පිළියෙල කළ යුතු වුවද, හරස් සටහන් මඟින්අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් ගැලපීමෙන් පසු ශේෂය,මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වීමහේතුවෙන් ලැබීම් රු.747,966 ක් හා ගෙවීම් රු.11,110,304 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර පොත් සමඟ එකඟ නොවීම

2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ඡේදයට අනුව දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂ සමඟ එකඟ වන බවට සහතික වී තිබුණත්, භාණ්ඩාගාර පොත් අනුව ආදායම හා දෙපාර්තමේන්තු පොත් අනුව ආදායම අතර රු.113,170,000 ක වෙනසක් පැවතුණි.

(ඇ) වෙනත් නිරීක්ෂණ

(i) මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමේදී පෙර වර්ෂයේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙළින් රු.2,765,912 ක් හා රු.12,619,345 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) දෙපාර්තමේන්තු පොත් අනුව වෙනත් මූලාශ්‍රවලින් ලද ලැබීම්වල ශේෂ එකතුව රු.846,675,062 ක් වුවද, එය අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයෙහි රු.959,845,062 ක් ලෙසට දැක්වීම හේතුවෙන් රු.113,170,000 ක වෙනසක් පැවතුණි.

1.6.2.2 වියදම්

භාණ්ඩාගාර පොත් සමඟ නොසැසඳීම

ඉහත 1.6.2.1(ආ) හි සඳහන් රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ඡේදයට අනුව දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂ භාණ්ඩාගාර ශේෂ සමඟ එකඟ වන බවට සහතික වී තිබුණත්, දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව වියදම් ශේෂය අතර රු.113,170,000 ක වෙනසක් පැවතුණි.

1.6.3 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට අදාළ ස්ථාන මාරු වී ගිය සහ ස්ථාන මාරු වී පැමිණි රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙළින් රු.34,283,496 ක් හා රු.53,270,928 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමේ දී එම අගයන් පිළිවෙළින් රු.46,770,074 ක් හා රු.55,906,988 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් ඉකුත් වර්ෂයට අදාළ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙළින් රු.12,486,578 ක් හා රු.2,636,060 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තු පොත් අනුව වෙනත් ආයතන වෙත මාරු වූ නිලධාරීන් වෙනුවෙන් පවරාදුන් ණය හා වෙනත් ආයතන වෙතින් මාරු වී පැමිණි නිලධාරීන් වෙනුවෙන් පවරාගත් ණය ශේෂ පිළිවෙළින් රු.36,439,248 ක් හා රු.55,643,387 ක් වුවද, එම අගයන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ රු.47,549,552 ක් හා රු.56,391,352 ක් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් පවරාදුන් හා පවරාගත් ණය ශේෂ අතරපිළිවලින් රු.11,110,304 ක හා රු.747,965 ක වෙනසක් පැවතුණි.

1.6.4 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.4.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය නොවන වත්කම්වල ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය රු.6,535,339,049 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ දී එම ශේෂය රු.6,611,958,391 ක් ලෙසට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් රු.76,619,342 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් විෂයයන් 03 ක අගය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු භාණ්ඩාගාර සටහන් අනුව රු.8,572,983 ක් හා විගණන අවස්ථාවේ දී භාණ්ඩාගාර දත්ත පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව රු.7,810,337 වූ බැවින් රු.762,646 ක වෙනසක් පැවතුණි.මෙම වෙනසට අදාළ තොරතුරු ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) වැය විෂය අංක 2102 ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ, 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ 2104 ගොඩනැගිලි හා ඉදිකිරීම් අත්පත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී දරා තිබුණු මූලධන වියදම රු.113,695,902 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එම අගය රු.33,928,200 ක් වූයෙන් රු.79,767,702 කවෙනසක් පැවතුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක් ඉදිරිපත් කර තිබුණු වත්කම් වාර්තා සැසඳීමේ දී වත්කම් විෂයයන් 03 කට අදාළව රු.21,321,307 ක වෙනස්කම් පැවතුණි.

1.6.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.5.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ

2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 6 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේ දී මුදල හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගත යුතුය. ඒ අනුව දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ලැබීම් රු.126,697,544 ක් වුවද, එය රු.113,655,870 ක් ලෙස රු.13,041,674 ක් අඩුවෙන් ද, අත්තිකාරම් ගෙවීම් රු.110,573,811 ක් වුවද, එය රු.97,532,137 ක් ලෙස රු.13,041,674 ක් අඩුවෙන්ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

1.6.5.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ

වෙනත් අමාත්‍යාංශ මඟින්(මූලධන වත්කම්, පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සහ හැකියා වර්ධනය හැර) අනෙකුත් මූලධන වියදම් වෙනුවෙන් දරන ලද රු.1,680,409,158 කවියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම ලෙස දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

නිසිඅධ්‍යයනයකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු මූල්‍ය ප්‍රතිපාදනවලින් රු.100,000 සිට රු.3,406,864 ක් හෙවත් ප්‍රතිපාදන මුදලින්සියයට 15 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදනඉතිරිවීතිබුණි.

2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ග්‍රාමීය මාර්ග හා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය මඟින් ග්‍රාමීය මාර්ග 53 ක් සංවර්ධනය කිරීම සඳහා රු.39,600,000 ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ව්‍යාපෘති 3676 ක් ක්‍රියාත්මක කිරීමට රු.1,682,402,748 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර, ඉන් රු.1,259,512,952 ක් හෙවත් සියයට 75 ක ව්‍යාපෘති 1430 ක් අවසන් කර නොතිබුණි.

(ඇ) මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ව්‍යාපෘති 17 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදී තිබුණු රු.2,215,302,808 ක ප්‍රතිපාදන මුදලින් එම ව්‍යාපෘති දෙසැම්බර්31 දිනට නිම නොකර රු.1,351,240,000ක ප්‍රතිපාදන ආපසු භරවා යවා තිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්,එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්,එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විග්‍රහ කර පහත දැක්වේ.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
	රු.	
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය		
xxiv හි 4.6 වගන්තිය	--	2011 පෙබරවාරි සිට 2020 අගෝස්තු දක්වා කාල පරිච්ඡේදය තුළ වැඩ තහනම් කර ඇති හා සේවය අතහැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන්අයවිය යුතු ණය අයකරගෙන නොතිබුණි.

2.5 තැන්පතු

පූජාපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉකුත් වර්ෂයේදී ඉදිකිරීම් සිදුකළ ව්‍යාපෘති 210 ක, රු.117,144,796 ක රැඳවුම් මුදල් පැවති අතර, රැඳවුම් කාලය ඉකුත්ව තිබුණි. ව්‍යාපෘතිවල පවතින අඩුපාඩු සෘජු නොකිරීම හේතුවෙන් මෙම රැඳවුම් මුදල් නිරවුල් කර නොතිබුණු අතර, එම අඩුපාඩු කොන්ත්‍රාත්කරුවන් ලවා ඉටු කරවා ගැනීමට හෝ මෙම රැඳවුම් මුදල් උපයෝගී කරගෙන අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යයන් ඉටු නොකිරීම

(අ) ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල මඟින් හතරලියද්ද ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසය අලුත්වැඩියා කිරීමසඳහා සමාලෝචිත වර්ෂයේ ලබාදී තිබුණු රු.940,000 ක මුදල අදාළ කාර්යය සඳහා උපයෝගී නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ මාර්ග 187 ක් සංවර්ධනය කිරීම සඳහා වැය විෂය 435-2-3-2-2506 යටතේ රු.127,161,000 ක ප්‍රතිපාදන අනුමත කරගෙන තිබුණද, ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හාරිස්පත්තුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල බලප්‍රදේශයේගිවිසුම්ගත වටිනාකමරු.1,975,000 ක කුළුගම්මන පිටවෙල ඇළ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය2021 දෙසැම්බර් 31දින වන විට නිමකළ යුතු වුවද, 2022 පෙබරවාරි 10 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී මීටර් 24.3 ක් දිග වැඩ වටිනාකමරු.386,991 ක ඇළ මාර්ග කොටසක් පමණක් ඉදිකර තිබුණු අතර, ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) හාරිස්පත්තුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේවැඩ වටිනාකමරු.1,950,000 ක සෙනරත්ගම සාම මාවතේ ඇළ වේල්ල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2022 පෙබරවාරි 10 දින වන විට ඉටුකළ යුතු වැඩවලින් සියයට 02 සිට සියයට 50 අතර පරාසයක,එකතුව රු.1,236,146 ක වැඩ කොටස් ඉටු නොකර ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.

3.1.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයයන්

ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහන යටතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුළ පිහිටි වසම්වල පිහිටුවා තිබුණු ග්‍රාම ශක්ති ජනතා සමිති සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 09 ක වසම් 23 ක සමිතිවලටරු.10,400,000 ක මුදලක් ලබාදී තිබුණි. එහෙත් 2022 පෙබරවාරි 28 දිනවන විට ඉන් රු.5,226,613 ක් උපයෝජනය කර නොතිබුණි. මෙය ලබාදී තිබුණු මුදලින් සියයට 50 ක්පමණ වන අතර, එම මුදල් ඌන උපයෝජිතව සමිති භාරයේ තබාගෙන තිබුණි.

3.2 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම්

1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදය හා මුදල් රෙගුලාසි 880 අනුව ඇප තැබීමට නියමිත නිලධාරීන් හා ඇප තැබිය යුතු තනතුරකට අලුතින් පත්කරනු ලබන නිලධාරීන් එසේ පත්වීම ලද දින සිට මාස 03 ක් ඇතුළත ඇප තැබිය යුතුය. එහෙත් පූජාපිටිය, ගලගෙදර, හතරලියද්ද, හාරිස්පත්තුව හා අකුරණප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ඇප තැබිය යුතු නිලධාරීන් 25 දෙනෙකුඇප මුදල් තැන්පත් කර නොතිබුණි.

3.3 පාඩු හා හානි

තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2021 අගෝස්තු 27 දින අනතුරට ලක්වී තිබුණු අතර, මුදල් රෙගුලාසි 104(3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව අනුව ඇස්තමේන්තුගත අලාභය රු.2,291,483 ක් වී තිබුණි. විගණිත දින වූ 2022 මාර්තු 25 වන විටද මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර පරීක්ෂණය සිදුකර අලාභය සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණු අතර, අලාභය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක විශ්‍රාමික නිලධාරීන් 61දෙනෙකු වෙත එකතුව රු.13,219,853 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා, පසුව ඔවුන්ගෙන් වාරික වශයෙන් රු.8,034,295ක් ආපසු අයකර තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් රු.5,185,558 ක් අයකරගත යුතුව පැවතුණි.

(ආ) හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී වසම් 03 ක ග්‍රාම ශක්ති ව්‍යාපාරය යටතේ 2021 දෙසැම්බර් 31 දිනට ලබාදුන් ණයවලින් තවදුරටත් රු.3,027,679 ක ශේෂයක් අයවීමට පැවති අතර, අඛණ්ඩව මාස 06 කට වඩා ගෙවා නොමැති ණය ශේෂය රු.2,442,820 ක් වී තිබුණි. මෙම ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් නිකුත් කළ ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය මාර්ගෝපදේශයේ 6 පරිච්ඡේදය මඟින් නිලධාරීන්ට පවරා තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4. යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

මහනුවර දිස්ත්‍රික්කයේ දිවිනැඟුම ප්‍රජාමූල බැංකුවලට අදාළව 2021 දෙසැම්බර් 31 දින වන විට ජීවනෝපාය වැඩිය අරමුදල් ශීර්ෂයේ ශේෂ එකතුව රු.173,690,665 ක් වූ අතර, ඉන්සමාලෝචිත වර්ෂය වන විට ලබාදුන් මුළු ණය ශේෂයෙන් පිටහිටි ශේෂය රු.78,754,685 ක් වී තිබුණි. අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ව්‍යාපෘතිය තුළින් ඔවුන් බලගැන්වීමේ අරමුණින් ලබාදෙන ණය වැඩසටහනෙහි රු.94,935,980 ක හෙවත් සියයට 55 කට අධික ප්‍රමාණයක් තවදුරටත් ණය ලෙස ලබාදීමට හැකියාව තිබියදී අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කර නොතිබුණි.

05. මානව සම්පත් කළමනාකරණය

(අ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති (කාණ්ඩ අංක 01) හි xviii පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව විධිවිධාන හා 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2001, මණින් රාජ්‍ය නිලධාරීන් වසර 05 කින් ස්ථාන මාරුවිය යුතු වුවද, පූජාපිටිය අකුරණ, මැදඋම්බර, හාරිස්පත්තුව, හතරලියද්ද යන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල අවුරුදු 05 ත් 22 ත් අතර කාලයක් පිළිවෙළින් නිලධාරීන් 21, 20, 09, 15 ක් හා 19 ක් එකම කාර්යාලයේ සේවය කරන බව නිරීක්ෂණය විය.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 හි පහත සඳහන් පරිදි පුරප්පාඩු පැවතුණි.

	සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
(i)	ජ්‍යෙෂ්ඨ මට්ටම	80	61	19
(ii)	තෘතීයික මට්ටම	76	37	39
(iii)	ද්විතියික මට්ටම	1882	1641	241
(iv)	ප්‍රාථමික මට්ටම	195	161	34
	එකතුව	2,233	1,900	333

ඒස්.එම්.විජේරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ - 01

04 පරිච්ඡේදය
ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1 සැලසුම් අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74%
සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන	98.5 %		
දිස්ත්‍රික් විමධ්‍යගත අයවැය වැඩසටහන	98.5%		
ග්‍රාමීය මාර්ග වැඩසටහන	100%		
වාරි සෞභාග්‍යා වැඩසටහන	100%		
ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන	100%		
විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධන වැඩසටහන	100%		
කිතුල් සංවර්ධන වැඩසටහන	100%		
වතු ආශ්‍රිත ක්‍රීඩාපිටි සංවර්ධන වැඩසටහන	100%		

4.2 ඉංජිනේරු අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74 %
ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය (ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදනයටතේ -උඩපළාත, මැදදුම්බර, අකුරණ, හතරලියද්ද, උඩුනුවර)	2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් ව්‍යාපෘති ආරම්භ කර නොමැත		
ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය (ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ) උඩදුම්බර, යටිනුවර, දෙල්තොට	100%		
ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය (නිල පියස රජයේ නිවාස සංකීර්ණය ඉදිකිරීමේ ඉතිරි වැඩ නිම කිරීම)	100%		
අළුත්වැඩියා කටයුතු අධීක්ෂණය (දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස අලුත්වැඩියා කිරීම)	100%		
ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය (ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදනයටතේ -උඩපළාත, මැදදුම්බර, අකුරණ, හතරලියද්ද, උඩුනුවර)	2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් ව්‍යාපෘති ආරම්භ කර නොමැත		
ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය (ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ) උඩදුම්බර, යටිනුවර, දෙල්තොට	100%		
ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය (නිල පියස රජයේ නිවාස සංකීර්ණය ඉදිකිරීමේ ඉතිරි වැඩ නිම කිරීම)	100%		
අළුත්වැඩියා කටයුතු අධීක්ෂණය (දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස අලුත්වැඩියා කිරීම)	100%		
පුහුණු වැඩසටහන් පැවැත්වීම (ප්‍රා.ලේ. කාර්යාල 20 හි සංවර්ධන නිලධාරීන් සඳහා)	100%		
පුහුණු වැඩසටහන් පැවැත්වීම (ප්‍රා.ලේ. කාර්යාල 20 හි තාක්ෂණ නිලධාරීන් Out Bound Training සඳහා)	තාක්ෂණ නිලධාරීන් සඳහාපුහුණු වැඩසටහන් ක්‍රියාත්මක නොවුණි		

4.3 ගිණුම් අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74 %
2021 වර්ෂයට මූල්‍ය බලතල පැවරීම	100%		
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම 2020	100%		
2021 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම	100%		
වැටුප් ගණනය කිරීම හා Payrool පරිතණක වැඩසටහවන මඟින් වැටුප් පිළියෙල කිරීම හා ගෙවීම	100%		
මාසික ඒකාබද්ධ ගිණුම් සාරාංශ පිළියෙල කිරීම	100%		
මාසික බැංකු සැසඳුම් පිළියෙල කිරීම	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අක් මුදල් නිදහස් කිරීම	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු සියලු මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කිරීම	100%		
ප්‍රතිපාදන වෙන් කරනු ලබන දෙපාර්තමේන්තු /අමාත්‍යාංශ වලට ප්‍රතිපාදන සීමාව තුළ ලිපිද්‍රව්‍ය නිකුත් කිරීම හා අදාළ ලේඛන නඩත්තු කිරීම	100%		
වත්කම් සත්‍යෝක්ෂණය කිරීම	100%		
ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම	100%		
සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම	100%		
අභ්‍යන්තර හා බාහිර විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිලි ඉදිකිරීම	100%		
ස්ථාන මාරු වී ගිය සහ පැමිණි නිලධාරීන් ගේ ණය ශේෂ නිරවුල් කිරීම හා ගිණුම් ගත කිරීම	100%		
ආදායම් රැස් කිරීමේ කටයුතු	100%		
ප්‍රතිපාදන කළමණාකරනය	100%		
පොදු තැන්පත් ගිණුමේ කටයුතු	100%		
වවුචර්පත් පරීක්ෂා කිරීමේ කටයුතු	100%		
සරප්ගේ රාජකාරි කටයුතු	100%		
අග්‍රිම පාලන කටයුතු	100%		
භාණ්ඩ මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු	100%		
විශ්‍රාම වැටුප් පිළිබඳ කටයුතු	100%		

4.4 ආයතන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74 %
දෛනික තැපෑල සම්බන්ධ කටයුතු	100%		
නිලධාරීන් අනුයුක්ත කිරීම	100%		
රාජකාරි පැවරීම	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන සම්බන්ධ සියළු කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වාහන සම්බන්ව දිස්ත්‍රික් ලේකම්තුමාට බලය පැවරූ ආයතන කටයුතු	100%		
වාහන සම්බන්ධ වෙනත් කටයුතු	100%		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74 %
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ ආයතන කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඒකාබද්ධ සේවයේ මාණ්ඩලික නොවන නිලධාරීන් රියදුරන්ගේ ආයතන කටයුතු	100%		
වෙනත් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ආයතන කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ආරක්ෂක /පිරිසිදු කිරීමේසේවයට අදාළ රාජකාරී කටයුතු	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරී නොවන ,ඒකාබද්ධ සේවයට අයත් සියළුම සේවාවන්ට අයත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු හා ආයතන කටයුතු	100%		
ග්‍රාම නිලධාරි විනය කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කළ /ඉදිරි වැඩසටහන් නිවාඩු,නිවාඩු දින වැටුප්,අතිරේක ඉන්ධන අනුමැතිය	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ආරක්ෂක /පිරිසිදු කිරීමේසේවයට අදාළ ගෙවීම් වවුචරය සකස් කිරීම	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාමර වෙන් කිරීම	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු ගොනුව	100%		
දිස්ත්‍රික් ලේකම් රාජකාරි දිනපොත යාවත්කාලීන කිරීම	100%		
ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කළ /ඉදිරි වැඩසටහන් නිවාඩු,නිවාඩු දින වැටුප්,අතිරේක ඉන්ධන හා විදේශ ගමන් අනුමැතිය	100%		
දිසාපති සමුළුව සම්බන්ධ රාජකාරි	100%		
ග්‍රාම නිලධාරි ස්ථානමාරු සම්බන්ධ රාජකාරි	100%		
ග්‍රාම නිලධාරීන් දෙමළ භාෂාවෙන් නිදහස් කිරීමේ රාජකාරි	100%		
ග්‍රාම නිලධාරි උසස් කිරීම සම්බන්ධ රාජකාරි	100%		
ග්‍රාම නිලධාරි ස්ථිර කිරීම සම්බන්ධ රාජකාරි	100%		
පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර/බලපත්‍ර නිකුත් කිරීම	100%		
පුපුරණ ද්‍රව්‍ය වාරික නිකුත් කිරීම	100%		
ගිනිඅවි භාර ගැනීම හා නිකුත් කිරීමේ කටයුතු	100%		
මාසික ප්‍රගති වාර්තා අමාත්‍යාංශය වෙත යැවීම	100%		
සංවර්ධන නිලධාරි පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම	100%		
අනුමත කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම	100%		
මැතිවරණ කටයුතු	100%		
නිල ඇඳුම් දීමනා රාජකාරි කටයුතු	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලේඛණාගාරයේකටයුතු	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අග්‍රහාර රක්ෂණ ක්‍රමයට අදාළ කටයුතු	100%		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74 %
සියළු නිලධාරීන්ගේ අතිකාල අනුමත කිරීමට අදාළ	100%		
ආකෘති පත්‍ර නිකුත් කිරීමට	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයට අදාළ රාජකාරි	100%		
දෛනිකවිද්‍යුත් තැපෑල පරීක්ෂාව හා අදාළ අංශ වෙත යොමු කිරීම	100%		
විද්‍යුත් ලිපි යැවීමේ කටයුතු	100%		
කාර්යාලීය වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම	100%		
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේකාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම	100%		
සියළුම නිලධාරීන්ගේ නිවාඩුසම්බන්ධ රාජකාරි	100%		
ඇඟිලි සළකුණු යන්ත්‍රය සම්බන්ධ කටයුතු	100%		
මාණ්ඩලික නිලධාරීන්ගේ නිවාඩු දින වැටුප් රාජකාරි	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ගේ නිවාඩු දින වැටුප් ගෙවීම් අනුමැතියට අදාළ කටයුතු	100%		
අත්තිකාරම් බී ගිණුම් යටතේ ණය ගෙවීම් සම්බන්ධ කටයුතු	100%		
ක්ෂේත්‍ර නිලධාරීන් ගමන් වියදම් වවුචර් සම්බන්ධ කටයුතු	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත වෙනත් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඉදිරි හා කළ වැඩසටහන් ගොනු නඩත්තු කිරීම්	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම්	100%		
ඇප තැන්පත් කිරීම් සම්බන්ධ කටයුතු	100%		
හදිසි මරණ පරීක්ෂක සම්බන්ධ කටයුතු	100%		
රෙජිස්ට්‍රාර් අංශයේ පොදු කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමුළුව පැවැත්වීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු	100%		
ඵලදායිතා හා විදේශ නියෝජිත සම්බන්ධීකරණ කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් සම්බන්ධව ලැබෙන පැමිණිලි ,ජනාධිපති ලේකම් කාර්යාලයෙන් හා අගමැති ලේකම් කාර්යාලයෙන් ලැබෙන පැමිණිලි හා වෙනත් මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු	100%		
නීති සම්බන්ධ කටයුතු	100%		
වෙනත් මහජන පැමිණිලි හා ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම	100%		
අමාත්‍යාංශ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සම්පත් හුවමාරුව හා සන්නිවේදන ජාලය කාර්යක්ෂමව පවත්වාගෙන යාම	100%		
කොරතුරු හා මෙවලම් වැඩිදියුණු කිරීම	100%		
නිල විද්‍යුත් සන්නිවෙදන පද්ධතිය පවත්වාගෙන යාම	100%		
දෛනික තැපෑල පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම	100%		
ලිපි තැපැල් කිරීමේ කටයුතු	100%		
ආයතන අංශයේ යන්ත්‍ර සූත්‍ර වලට අදාළ ගොනු කටයුතු	100%		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74 %
පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර/බලපත්‍ර නිකුත් කිරීම	100%		
පුපුරණ ද්‍රව්‍ය වාරික නිකුත් කිරීම	100%		
පතරොම් වාරික නිකුත් කිරීම	100%		
ගිනිඅවි භාර ගැනීම හා නිතුත් කිරීමේ කටයුතු	100%		
මාසික ප්‍රගති වාර්තා අමාත්‍යාංශය වෙත යැවීම	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ජල, විදුලි ,දුරකථන හා පුවත්පත් බිල්පත් පියවීමට අදාළ රාජකාරි	100%		
භාෂා දීමනාව ගෙවීමට අදාළ රාජකාරි	100%		
දුම්රිය බලපත්‍ර නිකුත් කිරීමට අදාළ රාජකාරි	100%		
නිවාස හා නිවාස කුලී අය කිරීමට අදාළ රාජකාරි	100%		
වරිපණම් බදු ගෙවීමට අදාළ අදාළ රාජකාරි හා ආයතන අංශයේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලටඅනුයුක්ත සියළුම සංවර්ධන නිලධාරීගේ සේවය ස්ථීර කිරීම,අනුයුක්ත කිරීම,ස්ථා මාරු කිරීම්,උසස් කිරීමේ කටයුතු හා විනය කටයුතු සම්බන්ධ රාජකාරි	100%		

4.5 ජන හා සංඛ්‍යා ලේඛන

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74 %
ශ්‍රීලංකාවේශ්‍රමබලසමීක්ෂණය -2021- සමීක්ෂණයපැවැත්වීම ශ්‍රීලංකාවේශ්‍රමබලසමීක්ෂණය - කේතකිරීම,සංස්කරණයහාපරිගණක ගතකිරීම (එක් එක් ප්‍රා.ලේ. කොට්ඨාශ භාර නිලධාරියා විසින් ඉටු කරනු ලබයි)	100%		
කාණ්ඩ 1 ඒ (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - සතිපතා)	100%		
කාණ්ඩ 1 (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - සති දෙක වරක්)	100%		
(විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම -සතිපතා)ICP	100%		
(විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - තිදෙකට)ICP	100%		
(විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම -මාසිකව)ICP	100%		
කාණ්ඩ 11 (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - මසකට වරක්)	100%		
නිෂ්පාදකයාගේමිල - (මසකට වරක්)LPAP	100%		
(විවෘත වෙළඳපොලමිල රැස්කිරීම - කාර්තුවකට වරක්)ICP	100%		
කාණ්ඩ 111 (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - කාර්තුවකට වරක්)	100%		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	**75% - 89%**	**50 % - 74 %**
මිල රැස්කිරීම - මාස හයකට වරක් ICP	100%		
වී අස්වනු සමීක්ෂණය	100%		
වීවගාකළ බිම් ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම හා දිස්ත්‍රික් වාර්තාව සැකසීම	100%		
ගොඩ භෝග පිළිබඳ සංඛ්‍යා ලේඛන එක්රැස් කිරීම හා දිස්ත්‍රික් වාර්තාව සැකසීම	100%		
මස්පිණිස මරනු ලබන සතුන් පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම	100%		
ගොඩනැගිලි සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම	100%		
පලාත්පාලන සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම	100%		
වාර්ෂිකඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය	100%		
දැවසංඛ්‍යාලේඛන රැස් කිරීම	100%		
සංඛ්‍යා ලේඛන නිබන්ධනය සකස් කිරීම-2020	100%		
වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය	100%		
2021 ජන හා නිවාස සංගණනය	100%		
ගව කුකුළු ආදි සතුන් පිලිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම	100%		
කාලීනව දෙපාර්තමේන්තුව මගින් පවරනු ලබන විවිධ සංගණන හා සමීක්ෂණ පැවැත්වීම	100%		

4.6 ආපදා කළමණාකරණ ඒකකය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	**75% - 89%**	**50 % - 74 %**
ආපදා අවමකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	100%		
ආපදා කළමනාකරණ දැනුවත් කිරීමේ කිරීමේ වැඩසටහන්	100%		
ආපදා පෙර සූදානම් සහ සැලසුම් සකස් කිරීමේ වැඩසටහන්	100%		
හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීමේ කටයුතු	100%		
මහජන පැමිණිලි පරීක්ෂාව සහ අදාළ ආයතන සම්බන්ධීකරණ කටයුතු		83.4%	
ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන හූ පරීක්ෂණ වාර්තා		78.57%	
ආපදා කළමනාකරණ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම	100%		

4.7 දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74 %
ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය(මැදදුම්බර ප්‍රා.ලේ.කොා. - නටුවාකැලේ)	100%		
තෝරා ගත් ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම්වල නිර්දේශ ක්‍රියාවට නැංවීම(මිණිපේ - වැල්ගාල වසම)	100%		
තෝරා ගත් ක්ෂුද්‍ර ජල පෝෂක සැලසුම්වල නිර්දේශ ක්‍රියාවට නැංවීම	100%		
පස හා ජල සංරක්ෂණය තුළින් ඌණ පරිහරණ කෘෂිකාර්මික බිම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම	100%		
භාවිතයට ගත හැකි එහෙත් භාවිතයට නොගන්නා ඉඩම් සහ ඌණ පරිහරණ ඉඩම් හඳුනා ගැනීම	100%		
ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳ සමීක්ෂණය (නියමු ව්‍යාපෘතිය)		80%	
තරුණ ව්‍යවසායකකත්වය දිරි ගැන්වීම සඳහා රජයේ ඉඩම්වල ආයෝජන අවස්ථාලබා දීමේ ව්‍යාපෘතිය(පළමු අදියර හා දෙවන අදියර ප්‍රතිපාදන එකතුව රු191350.00+රු.25250.00)	100%		
රාජ්‍ය ව්‍යාපාර සතු භාවිතයට නොගන්නා ඉඩම් හා දේපල හඳුනා ගැනීම හා යෝග්‍යතාවය නිර්ණය කිරීම	100%		
දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව	100%		
ප්‍රාදේශිය ඉඩම් පරිහරණ කමිටුව	100%		
ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය		80%	
ඉඩම් පරිහරණ කළාපීකරණ සැලැස්මක් සකස් කිරීම	100%		
අවශේෂ ඉඩම් ලෙස ප්‍රකාශයට පත් ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම	100%		
රටේ ජාතික නිෂ්පාදනය ඉහල නැංවීම සඳහා ස්වේච්ඡා දායකත්වය ලබා දීම	100%		

4.8 ඉඩම් අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74 %
පරිසර කමිටු හා ඉඩම් කටයුතු පිළිබඳ කමිටු රැස්වීම	90%		
විවිධ ආයතන හා මහජනතාව විසින් යොමුකර ඇති පරිසර පැමිණිලි		75%	
පරිසර විශේෂ වැඩසටහන්(මෙම ආයතනය මඟින් සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදු වේ.)	Covid 19 වසංගත තත්වය මත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.		1%
මහජනතාව විසින් යොමු කර ඇති ඉඩම් සම්බන්ධ පැමිණිලි	99%		
විවිධ ආයතන විසින් යොමු කර ඇති ඉඩම් සම්බන්ධ පැමිණිලි		79%	

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74 %
ඉඩම් නඩු (අධිකරණයේ විභාග වෙමින් පවතින නඩු අතරින් කොවිඩ් වසංගත තත්වයට අනුව කැඳවන ලද්දේ නඩු 02 ක් පමණි.			38%
විවිධ ආයතන හා මහජනතාව විසින් යොමු කර ඇති පරිසර පැමිණිලි			75%
දෛනික තැපෑල	100%		
ඉඩම් කටයුතු -ඉඩම් අත්පත්	100%		-
දැව හෙලීම	135%		
ජල විදුලි කටයුතු		85%	
යටිතල පහසුකම්			71%
නිල නිවාස සම්බන්ධ කටයුතු	95%		
නිවාස අළුත්වැඩියා කිරීම		24%	
නව ගොඩනැගිලි ඉදි කිරීම (ඉදිකරමින් පැවති නව ගොඩනැගිල්ලේ කටයුතු අවසන් කර ඇත.දි.ලේ.කා මණින් සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදු කරයි.)			
රජයේ ගොඩනැගිලි සම්බන්ධ කටයුතු	අපේක්ෂිත නව ව්‍යාපෘති ආරම්භ කර නොමැත.		
ගිනි අවි සම්බන්ධ රාජකාරි	99%		

4.9 ආගමික කටයුතු (බෞද්ධ කටයුතු)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50 % - 74 %
ඌණ සංවර්ධිත විහාරස්ථාන සංවර්ධනය	100%		
ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය	100%		
අයහපත් කාලගුණයෙන් විපතට පත් විහාරස්ථාන	ඉලක්ක කළ ද අයහපත් කාලගුණික තත්වයන් සිදු නොවිණි)		50%
තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන් යටතේ, දහම් පාසල් පුස්තකාල උපකරණ ලබාදීම-සාරධර්ම හා ආර්ථික සංවර්ධන වැඩසටහන්-221	100%		
ආගමික උත්සව	කොවිඩ් 19 තත්වය මත ඉලක්ක කරා ලඟාවීමට නොහැකි විය.		50%
සිසු නිපුණතා	කොවිඩ් 19 තත්වය මත වැඩසටහන් නොකරන ලදී.		
දහම් සරසවි පාඨමාලාවපාඨමාලා	100%		
*පාලි භාෂා පාඨමාලාව	කොවිඩ් 19 තත්වය මත වැඩසටහන් නොකරන ලදී.		
ගුරු පුහුණු වැඩසටහන්	කොවිඩ් 19 තත්වය මත පුද්ගලයින් ඒකරාශි කිරීමට නොහැනි විය.)		50%
දහම් පාසල් ගුරු දීමනා	100%		
දන්ත තොරතුරු පද්ධතිය	100%		
ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු	100%		

4.10 ආගමික කටයුතු (හින්දු ආගමික කටයුතු)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	**75% - 89%**	**50 % - 74 %**
ඌණ සංවර්ධිත හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය,අළුත්වැඩියාව හා සංවර්ධනය	100%		
ඌණ සංවර්ධිත හින්දු දහම් පාසැල් සඳහා උපකරණ ලබාදීම	100%		
හින්දු උත්සවය	100%		
තිරසර පුණ්‍යාග්‍රාම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	100%		
දහම් පාසැල් ගුරු දීමනා ගෙවීම් සම්බන්ධ කටයුතු	100%		
දහම්පාසැල් ගුරුවරුන් සඳහා දහම් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	100%		
තොරතුරු දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම	100%		

4.11 ආගමික කටයුතු (ක්‍රිස්තියානි ආගමික කටයුතු)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	**75% - 89%**	**50 % - 74 %**
දේවස්ථාන ප්‍රතිසංස්කරණය, අලුත්වැඩියාව, හා සංවර්ධනය.	100%		
ඌණ සංවර්ධිත දහම් පාසල් සඳහා උපකරණ ලබාදීම.	100%		
ගැටළුකාරී හා අනවසර ආගමික ස්ථාන සම්බන්ධව ක්‍රියාත්මක විම්.	100%		
දහම් පාසල් දරුවන් සඳහා කාණ්ඩ 03 ක් යටතේ දහම් පාසල් රචනා,දැනුම මිනුම තරඟ පැවැත්වීම.	100%		
මහනුවර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් සඳහා චතාරික - පාස්කු වැඩසටහන(පදවි ජන සන්නිවේදන කේන්ද්‍රය හා එක්ව සිදුකරන ලදි.	100%		
දහම් පාසල් ගුරුවරුන් සඳහා දහම් අධ්‍යාපන වැඩසටහන	100%		

4.12 ආගමික කටයුතු (ඉස්ලාම් ආගමික කටයුතු)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100%- 90%	**75% - 89%**	**50 % - 74 %**
ඌණ සංවර්ධිත මුස්ලිම් පල්ලිය	දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදන නොලැබීම නිසා ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.		✓
තිරසර පුණ්‍යාග්‍රාම වැඩසටහන්			✓
දහම් පාසල් ගුරුවරුන්ට නිල ඇඳුම් ලබාදීම	✓		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100%- 90%	75% - 89%	50 % - 74 %
ආගමික උත්සව		✓	
දහම් පාසල් ගුරු දීමනා	✓		
දත්ත තොරතුරු පද්ධතිය	✓		

4.13 සංස්කෘතික අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% -89%	50% - 74%
